මහත් ජනතාවක් නගරයට පැමිණෙයි !


හෙට යුදෙව්වරුන්ගේ අති ශුද්ධ ජාතික මංගල්‍යය වන මහා සබත් දින (පාස්කුව) යෙදී ඇත.
............... දන් පිටත මළුව, ඔබ දකින්ට කැමති ජනයාගෙන් පිරෙමින් තිබේ.
තවද ඔවුන් කැමති සිරකරුවෙකු ඔබ නිදහස් කර දෙතැයි බලා සිටියි.
මං දන්නවා, තවද මට අදහස් තියෙනවා.
බරබ්බස් නිදහස් කර අපට ඕනැයයි අපි සැමදෙනා එකඟවෙනවා !
එකඟයි බරබ්බස් !
රෝමවරුන් බිඳ හෙළීමට ත්‍රස්තවාදී උපායන් යොදා ගැනීමට බිය නැති නියම කැරළිකරුවෙක්
යෙරුසලමේ පුරවැසියෙනි ! කරුණාකර නිශ්චලවන්න. නුඹලාගේ පාස්කු මංගල්‍යය සමාදානයෙන් සැමරීම අපව අවශ්‍ය වේ. තවද සියලු වන්දනාකරුවන් හොඳින් පිළිගන්නවා ඇතැයි බලාපොරොත්තු වේ.
දහමට ලැදිවූ (සෙලට) අපට බරබ්බස්වාගේ මිනිහෙක් අවශ්‍යයි !


එන්න තිබෙන ප්‍රශ්න වළක්වාලන පිණිස, රෝම හමුදාව ශක්තිමත්ම සිටඩෙල් අන්තෝනියා හී සිට රැක බලා සිටින බව, ඔබට මතක්කරමි.
අවසානයේදී, පාස්කු කාලයේ චාරිත්‍රානු පරිදි, නුඹලා කැමති සිරකරුවෙකු මට නිදහස් කරන්නෙමි.
ඔවුන්ගෙන් දෙදෙනෙක් බොහෝ ප්‍රසිද්ධයි. යේසුස් හා බරබ්බස් ඔවුන්ගෙන්, නිදහස්කරදීමට නුඹලා කැමති කවුරුන්ද?
අපට බරබ්බස් දෙන්න !
බරබ්බස් දිගුකල් ජීවත් වේවා !
බරබ්බස් නිදහස් කරන්න !
නාසරෙත්හි යේසුස්, මහා දිවැසිවරයාණන් ගැන ඔවුන් කියනවා මට ඇසුණාද? එතුමාව රෝමවරුන් අල්ලා ගත්තාද?
කවදාද? කුමන හේතු සඳහා ද?
පෙනෙන හැටියට, ජනතාවට දනුම් දී නැහැ. .... නැත්නම් ඔවුන් ඇවිත් යේසුතුමා උදෙසා පෙනී සිටිනවා.
මට වැඩියෙන්ම පෙනෙන්නේ ධර්මයට ලැදි (සෙලට්ස්) අය හා විදේශීය කොපමණ කණ්ඩායමද?
කොතරම් පුදුමාකාර ජනතාවක්ද? ඔවුන් ප්‍රඥාවන්ත හා අහිංසක මනුෂ්‍යයෙකුට වඩා කැමති වුණා !
මේ ෆරිසිවරුන්ගේ සැලැස්ම මාරුකරන්න මට හැකිදැයි සිතුවෙමි.


නිශ්ශබ්දවන්න ! මං සිරකරුවන් දෙදෙනා එළියට ගෙනෙන්නම් එවිට ඔබට ඔවුන් බලා හොඳ තීරණයක් ගන්න පුළුවන්.
රැකවලුනි ! යේසුස් හා බරබස්බස් මෙහි ගෙනෙන්න !
මිනිහාව බලාගන්න.
නෑ. යේසුස් නොවේ, නුමුත් බරබ්බස් !
බරබ්බස් ! අපට ඕනේ, බරබ්බස් ! ඔහුව මුදා හරින්න !
කුරුසිපත් කරනු! යේසුස් කුරුසිපත් කරනු. ඔහු මරණය විඳීමට සුදුස්සෙක්.
ඔව් ! බරබ්බස් කැඳවන්න ! ඔබ ජාතියට මහත් සේවයක් ලබාදෙයි.
යේසුස් පරීක්ෂකයෙක් ! එතුමා ජනතාව මුළාකරයි !
බරබ්බස් !!
බරබ්බස් !!
නාසරෙත්හි යේසුස් මරණයට පත් කරන්න නුඹලාට ලැජ්ජා නැද්ද?
රෝගීන්, අන්ධයින් හා අංශබාගින් සුවකරන, .... දුප්පතුන්ට, ආත්මාර්ථකාමීන්ට හා බලාපොරොත්තු ගෙන දෙන දිව්‍යසිවරයා.


අහෝ බලන්න කෙතරම් දරුණුද? ඔවුන් යේසුතුමාට තැලුවා.
අපි හිතුවා, අප බලා සිටි මෙසියස් තුමා ඔහුය කියා.
යේසුතුමා කුරුසිපත් කිරීමට තීන්දුව දීමට බල කරන්ට නුඹලාට උවමනාද, ඔබම එතුමාව රැගෙන ගොස් කුරුසිපත් කරන්න. මට නම් එතුමා අහිංසක බව ජේනවා.
මරා දමීමට අපට තවත් අයිතියක් නැහැ. නුමුත් අපේ ව්‍යවස්ථාව පරිදි එතුමා මිය යෑමට අවශ්‍යයි, මන්ද එතුමා දෙවියන් වහන්සේගේ පුත්‍රයා යයි තමන් ගැන ප්‍රකාශ කළා.
පරිස්සම් වෙන්න, පිලාත්, ඔබ කරදරයට වැටෙන්නයි යන්නේ
එතුමා, තමන් රජෙකු බව කීවා. එහෙයින් එතුමා රෝමයේ කායිසර්ට එරෙහි වුනා. ඔබ එතුමාව නිදහස් කරන්නේ නම්, ඔබට තව දුරටත් කායිසර්ගේ මිතුරෙකුවීමට නොහැකියි.
කරුණාකර, ඔබේ තත්වය අවදානම් කර ගන්න එපා. යුදෙව්වෙකු යයි ස්ථිරව නොකිය හැකි සේ, නුඹට එය කුමක්ද?
මේ අහිංසක මිනිසා නිරීක්ෂා කිරීමෙහි ලා නොනැවතී නොසිටින්න. එතුමාගේ සෙනඟගේ නායකයාට උවමනාවන්නේ කෙසේ හෝ එතුමා මැරෙන එකයි. ඔබ එතුමාව මුදා හරින්නේ නම්, ඔවුන් ඔබ පිළිබඳව තිබේරියස් ආණ්ඩුකාරයාට පැමිණිලි කරයි.
යෙරුසලමේ පුරවැසියෙනි, මං ඔබේ රජව කුරුසිපත් කරන්නේද?
රෝමයේ කායිසර් හැර, අපට රජෙක් නැත.


එතුමා අපේ රජ වෙන්න උවමනා ඇයි? මේ කටු ඔටුන්න හා මේ විහිළු වස්ත්‍රයක් සමග ?
මෙසියස් තුමා එතුමා අපේ රජ? එතුමාගෙන් බැහැරවෙන්න. එතුමා කුරුසිපත් කරන්න
එතුමාව කුරුසිපත් කරන්න
පිලාත් රැවටීමට උත්සහ කරන නුඹ කවුද?
එය ඔබේ වගකීමයි.
මම, මගේ අත් සෝදා නිදොස් වෙමි.
මාගේ විනිශ්චය නම්: බරබ්බස්, යෙරුසලමේ පුරවැසියන්ගේ කැමැත්ත අනුව මේ පාස්කුවේදී ඔබ නිදහස් කර ඇත. ඔබ නාසරෙත් හි යේසුස් කුරුසිපත් කරනු ලැබේ.
බරබ්බස් දිගුකල් ජීවත් වේවා.
බරබ්බස් දිගුකල් ජීවත් වේවා.
අහෝ, යෙරුසලමේ උරුම ඇති ජනයා යේසුතුමා ආරක්ෂා කිරීමට මෙහි සිටියේ නැහැ! ......මේ නොවටිනා බරබ්බස්ගේ පාර්ශවයේ අය පමණයි!


මෙන්න බරබ්බස් වෙනුවට හිලව් කළ තැනැත්තා
කරදර වෙන්න එපා. අපි එතුමා ගැන බලා ගන්නම්.
එතුමා බොරුවට රජෙකු වෙන්න හැදුවා. ඒ නිසා එතුමා නියම හොඳ සැලකිල්ලක්. රාජකීය විදියට දෙන්න.
මෙදින තිදෙනෙකුට මරණ දණ්ඩනය නියමවී තිබුණා. චාරිත්‍රය අනුව, සෑම දඬුවම් විඳි මනුෂ්‍යයෙකුටම කස පහර ගැසිය යුතුයි.
යුදෙව්වන්ගේ රජතුමාට ඒ හොඳයි. මං හිතන්නෙ එතුමාට හොඳටම ලැබුණා ඇති.
දැන් යේසුතුමාට එතුමාගේ කුරුසියේ හරස් ලී කඳ උසුලාගෙන, විනිශ්චය ප්‍රකාශ කරන ලද දැන්වීම එතුමාගේ කරෙහි ලාගෙන යෑමට නියම විය.


දුක්මුසු පෙරහැර ගමන් ඇරඹුනි
ඉඩ සලසන්න. අපට යන්න.
අර එක්කෙනා කවුද?
ඔහු නාසරෙහි නී යේසුස් වගෙයි..... සුප්‍රසිද්ධ දිවැසිවරයා !


යහපත පමණක් කළ මනුෂ්‍යයා. අපට මෙහි පෙනෙනවා: ඔහු රෝගීන් සුව කළා දුප්පත් හා මඩනා ලද්දන් රැක ගත්තා. අහෝ, කොපමණ දරුණු අයුතුකමක්ද?
ඔවුන් වෛරයෙන් එතුමාව රෝමවරුන්ට පාවා දුන්නා. ඔවුන්ට ශාප වේවා.
එතුමා සැබෑව කථා කරමින් ඵරිසිවරුන්ගේ වංචාව හෙළිකළ නිසා, ඔවුහු එතුමාට වෛර කළහ.
එක්කෙනෙක් බිම වැටෙනවා.
එතුමාගේ කුරුසිය රැගෙන යෑමට එතුමා බොහෝ දුර්වලව සිටියා: පහරදීම් නිසා එතුමාගේ ලේ බොහෝ සේ නැතිවුණා.
ඔයි, නුඹ! මං නුඹට අණ කර සිටිනවා. මේ දඬුවම් විඳින මිනිහගේ කුරුසිය ගොල්ගොතා දක්වා ගෙන යන ලෙස එය අණක්! දන්, කීකරුවන්න.
මං?....... නුමුත් මං යෙරුසලමේ කෙනෙක් නොවේ ! මං සිරියෙන් පැවත එන කෙනෙක් !
ඥාණවන්ත වෙන්න, විරුද්ධ වෙන්න එපා නැති නම් ඔබට කණගාටු වෙන්න වේවි. රෝමවරු දරුණුයි. ඇරත්, මෙහි සිට ගොල්ගොතාට වැඩි දුරක් නැහැ.
මං ඔබ උදෙසා උසුලන්නම් ! නැගිටින්න !
එතුමට උදව් කරන්න, එතුමා අහංසකයි. එතුමා නාසරෙත්හි යේසුස්, මහා දිව්‍යසිවරයා.


යෙරුසලම් දියණියෙනි, නුඹලා මා උදෙසා වැලපෙන්නේ මන්ද? නුමුත් නුඹලාත් නුඹලාගේ දරුවන් උදෙසාත් යාච්ඤා කරපල්ලා.
මෙතැන් පටන් වැඩිකලක් යන්නට මත්තෙන්, යෙරුසලම මත දරුණු විනිශ්චයක් පැමිණෙනවා.
බලන්න, මරණය සිදුකිරීම සඳහා වූ ස්ථානය මෙයයි. මෙයට ගොල්ගොතා නැතහොත් "හිස්කබල" යයි කියනු ලැබේ.
ඈත සිට බලන විට පර්වතය හරියටම හිස්කබලක් වාගේ පෙනෙයි
තවද, මේ ස්ථානය හොඳහැටි තෝරාගෙන තියෙනවා. යෙරුසලමට එන සැමටම, රෝමවරුන්ට අභියෝජ කිරීමේ මිළය සිහිපත් කරවනවා.


ඔවුන් ගොල්ගොතාට පැමිණෙන විට, ඔවුන්
යේසුතුමාගේ වස්ත්‍ර කුරිරු ලෙස ඉවත් කර දමයි.
මේ වස්ත්‍ර ගොඩගසා පැත්තෙන් තබන්න. අපි ඒවා පසුව බෙදා ගනිමු.


කපිතාන්, වේලාව කීයද?
දැන් මධ්‍යාහ්න විතර ඇති.
එතුමා අන් අයව ගැළෙව්වා. දැන් එතුමට තමන්ම ගළවාගන්ට ඉඩ දෙන්න, එතුමා ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම්!
ඔබ මෙසියස් තුමා නම්, බැස තමන්ම ගළවාගන්න.
පියාණෙනි, ඔවුන් කරන දේ, ඔවුන් නොදන්නා බැවින් ඔවුන්ට සමාව දෙන්න.
එතුමාගේ කබාය උදෙසා අපි දාදු දමමු.
තුඹට පිපාසයි: එය මරණයේ උණයයි. මෙන්න, කාඩිය ටිකක්.



නුඹ ක්‍රිස්තුස් නොවේද? ගැළවුම්කරු? නුඹත් අපත් ගළවන්න.
නිශ්ශබ්ද වෙන්න. නුඹ දෙවියන්වහන්සේට භය නැද්ද? අපේ අපරාධවලට සුදුසු පරිදි අප කුරුසිපත්කර ඇත්තේ යුක්තියටයි. නුමුත් එතුමා අහිංසකයි. එතුමා කිසිවරදක් කර නැහැ.
යේසුනි, ඔබේ රාජ්‍යයට ඔබ එන විට මා සිහි කරන්න.
මම නුඹට සැබෑව කියමි. අද නුඹ මා සමග පාරාදීසියේ සිටිනවා ඇත.
පියාණෙනී, ඔබේ අත්වලට මාගේ ආත්මය භාරදෙමි.
අර වළාකුළු දෙස බලන්න. හොඳටම කළුවර වේගෙන එනවා. නුමුත් තවම සවස තුනයි වේලාව
අපට වෙන්නේ කුමක්ද?


බොහෝ සිරකරුවන් මැරෙනවා මං දක තියෙනවා, නුමුත් මේ වාගේ නොවෙයි. සැබවින්ම මේ මිනිසා දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන්මයි.
කපිතාන්, පිලාත්ගෙන් පණිවිඩයක්.
මරනු ලැබූ අයගේ කකුල් කඩා දමා, සිරුරු කුරුසිවලින් ඉවත් කරන ලෙස, පිලාත්මට නියෝග කළේය, සබත් කාලය තුළ මෘත ශරීර කබා ගැන්මට යුදෙව්වන් කැමති නැහැ. මන්ද, එයින් ජනතාව මත ශාපයක් පැමිණෙන්ට පුළුවනැයි මතයක් තිබිණ.
හේවායින්, වරදකරුවන්ගේ කකුල් කඩා දමයි. මන්ද එයින් ඔවුන්ගේ මරණය ඉක්මන් වේ.


එතුමා දැනටම මැරිලා.
ස්ථිර කරන පිණිස අපි එතුමාගේ ඇලය සිදුරු කරමු.
තුමාගේ හදවතෙන් වතුර හා රුධිරය ගලයි.
ඒ අතරතුරේදී....
අපිමාතියේ යෝසෙප් මට හොඳටම මහන්සියි
ඉක්මන් කරන්න, නිකොදේමුස්, ඉක්මණින් රෑ වෙයි.
යේසුතුමා මිනිමරුවෙකුසේ මැරුණුසේක. මම නම් එතුමා සැබවින්ම මෙසියස් තුමා බව විශ්වාස කරනවා.
යේසුතුමාගේ දේහය මට භූමදාන කරන්ට පුළුවනැයි සිතා, මං එතුමාගේ දේහය රැගෙන යාමට පිලාත්ගෙන් අවසර ඉල්ලා සිටියා.
මෙතැනින් වැඩිදුරක් නැතිව, පාවිච්චි නොකළ සොහොනක් සහිත උයනක් මට තියෙනවා. යේසුතුමාගේ දේහය එහි භූමදාන කිරීමට මං තීරණය කළා.
එතුමාගේ මරණය මා ඇසූ සැණින් මං සුවඳලාටු හා අහිල් මිශ්‍රණයක් හැදුවා. යෝසෙප්ද දේහය ඔතන පිණිස වූ රෙදි කච්චියක් හා හණපටි ගෙනෙයි.
පාස්කුව හා සබත ප්‍රසිද්ධ කරන හොරණෑවට ප්‍රථම අපි ඉක්මන් කරමු. ඉන් පසුව එතුමාව භූමදාන කිරීමට අපට අවසර නැහැ.









අන්තිමේදී ඉතා බරවූ ගල සොහොනට
ඇතුල් වෙන තැනට පෙරළා දැමීය.








උදෑසන වේලාසනින්, පාස්කු සබතට පසුදා, ස්ත්‍රීන් සොහොනට යන්නේය.....
සලෝමි, ගිය සතියේ අපට ඇති තරම් වේලාවක් තිබුණේ නෑ.
....යේසුතුමාගේ දේහය හරියාකාරව සූදානම් කිරීමට.
මග්දලීන් සොහොනට ඇතුල්වෙන තැනින් ගල පෙරලන්නේ කවුද?
...නුමුත් මේ තොම්බර එකේ සුවඳ ද්‍රව්‍යවලින් අපට හරියට කරන්න පුළුවන්!
මට නම් ස්ථිර නෑ, නුමුත් අපි තිදෙක්ම ඉන්නවා.
බලන්න, ගල පැත්තක තියෙන්නේ. සොහොන විවෘත වෙලා.
අපට පෙර කවුරුත් මෙහි සිටියාද? හිරු මේ දැන් උදා වුණා පමණයි
අහෝ, කොපමණ භයානකද, කොපමණ දරුණුද, ඔවුන් යේසු - තුමාගේ දේහය රැගෙන ගිහින්,
එතුමා මෙහි නැහැ. කුමක් සිදුවුයේද?
හිටිහැටියේම මට සිහිවෙනවා. එතුමා කිව්වා එතුමා පමණින් නැගිටින බව
අපි මෙහි සුවඳ ද්‍රව්‍ය හැරයමු. මං දුව ගොස් ගෝලයින්ට කියන්නම්!


යොහාන්, පේත්‍රුස්, මා කෙළින්ම එන්නේ සොහොනේ ඉඳලා. නුමුත් එය හිස් යේසුතුමාගේ ශරීරය ගොසින්.
අපගොස් අපම බලා ගනිමු.
යොහාන්, ඔයා දුවනවා වේගෙත් වැඩියි. මට හුස්ම ගන්නත් බෑ.
පේත්‍රුස්, නුඹ පළමුව ඇතුළට යන්න.
යොහාන්, මෙහි බලන්න.
යේසුතුමාගේ දේහය ඔතා තිබූ හණපටි වලට අත ගසා නැහැ. සිදුවී ඇති දේ ගැන මං පුදුම වෙනවා.
මෑත ශරීරයක් මේ විදියට සොරකම් කරන්නේ නෑ. රෙදි ඇතිව හෝ නැතිව එය රැගෙන ගිහින්වත්ද, එසේ නම් රෙදි ඇවිස්සිලා තියෙන්න ඕනේ. මෙය අභිරහසකි. මට පුදුමයි.
මං නිකම්ම ගොළුවෙලා. මට සිතා ගන්නවත් බැහැ.
අපි යමු, අපට මෙහි කිසිවක් කරන්න බැහැ.
දැන්මට පේනවා. මං විශ්වාස කරනවා. එතුමා මරණින් නැගිටලා.


මග්දලායේ මරියා සොහොනට ආපසු ගොසින්.... පුදුමවෙමින් හා හඬමින්....
ස්ත්‍රිය, ජීවත්ව සිටින අය මළවුන් අතරේ නුඹ සොයන්නේ මන්ද?
නුඹ අඩන්නේ මන්ද? කාරණය කුමක්ද?
උයන්පල්ලා, නුඹ එතුමාගේ දේහය රැගෙන ගියේ නම්, නුඹ එතුමාව තැබුවේ කොහේදදයි මට කියන්න....
මරියා !
ස්වාමීවූ යේසුනි?


මගේ ස්වාමිනි,
මට අත ගසන්න උත්සාහ කරන්න එපා
......මන්ද ස්වර්ගයෙහි මාගේ පියාණන් වෙත මම ආපසු යන්නෙමි. නුඹත් ගොස් මාගේ ගෝලයින්ට කියන්න!
මිතුරෙනි, ස්වාමිවූ යේසුස් මම දුටිමි. එතුමා ජීවමානයි, එතුමා නැගිටලා, එතුමා මට කී දේ අසන්න.
මරියා, ඔබේ හැඟීම් ඔබ මුළුමණින් වෙලාගෙන.
සිහිනුවණ ඇතිව කල්පනාකාරීව ඉන්න: එය නම් සිදුවිය නොහැකියි.
විචිත්‍ර කල්පනා! සියල්ල ස්ත්‍රීන්ගේ සිහිනයන් !


එදිනම, සවස් කාලයෙහි, ගෝලයින්ගෙන් දෙදෙනෙක් යෙරුසලමේ සිට එම්මාවුස්ට ගමන් කළේය....
මොනතරම් කලකිරීමක්ද? මං යේසුතුමා විශ්වාස කළා. තවද ලෝකයා බලා සිටින මෙසියස්තුමා, එතුමා යයි මං හිතුවා.
ඒ වෙනුවට එතුමට මරණතීන්දුව දී, මිනීමරුවෙකු සේ කුරුසිපත් කළා.
එහෙමයි කෙලයෝපස්, කෙතරම් කලකිරීමක්ද? මමත් ඔබ වාගේම වියවුල් වෙලා....
සාමය වේවා, මිතුරෙනි, ඔබ කණගාටුවෙන් සිටිනවා වාගේ, තුඹලා සාකච්ඡා කරන්නේ කුමක්ද?
විස්තර කරන්න. උත්සාහ කරන්න: සමහරවිට උදව් කිරීමට මට හැකිවෙයි.
මේ දිනවල යෙරුසලම සෙලවූ සිදුවීම් ඔබ දන්නේ නැද්ද? නාසරේහි යේසුස් ගැන දේවල්?
අපි බලාපොරොත්තු වුණා. ඊශ්‍රායෙල් මුදන තැනැත්තා මෙතුමාය කියා.
එසේය, එතුමා ක්‍රිස්තුස්මයි... නුමුත් එය හමාරයි.. දන්
මේ දේවල් සිදුවී තුන්වැනි දිනයි. එතුමා මිය ගිහින්.
අපේ සමහර ස්ත්‍රීන් අපව පුදුමයට පත් කළා.....
මේ හිමිදිරියේ ඔවුන් සොහොනට ගියා....


......නුමුත් එතුමගේ ශරීරය හමුවී නැහැ. ඔවුන් අපට කීවා, එතුමා ජීවත්ව ඉන්නවා? යි ඔවුන් දුටු දේවදූතයෝ කී බව.
ස්ත්‍රීන් කේලම් කියනවා. අපේ සමහර මිතුරන් සොහොනට ගියා ස්ත්‍රීන් කී ලෙස එය හිස්ව තිබෙනවා ඔවුන් දුටුවා. නුමුත් ඔවුන් යේසුතුමා දුටුවේ නෑ... ඒ නිසා කුමක් සිතන්න දයි අප දන්නේ නැහැ.
ඔබ කොපමණ අඥානද? දිවැසිවරුන් ලියාතිබෙන දේ විශ්වාස කිරීමට සිත කොපමණ ප්‍රමාද ද?
එතුමා පිළිබඳව මුළු ලියවිල්ලේ කියා ඇති දේ මං ඔබට විස්තර කර දෙන්නම්....
අපි මහත් උනන්දුවකින් යුතුව ඔබට සවන් දෙමින් සිටියා.
පැයකට පසුව....
අප එම්මාවුස්ට පැමිණියා... අප සමහ සිටින ලෙස අපි ඔබට ආරාධනා කරනවා.


කොහෙත්ම ප්‍රශ්නයක් නැහැ. අප සමග ඉඳ ඔබේ ගමන හෙට අරඹන්න.
ඔබට ස්තුතියි, මං පිළිගන්නවා.
ඔවුන් මේසයේ සිටිය දී, එතුමා රොටී රැගෙන, ස්තුතිකොට කඩා ඔවුන්ට දුන්සේක...
එවිට ඔවුන්ගේ ඇස් පැහැදී එතුමාව හඳුනාගත්තේය.
නුමුත් එතුමා ඔවුන් ඉදිරියෙන් නොපෙනී ගියසේක.
ඉක්මන් කරන්න. ආපසු යෙරුසලමට....
අපි ගෝලයින්ට කියන්න ඕනේ.
යේසුස් ජීවමානයි! යේසුස් ජීවමානයි!


එතුමා අපට ලියවිල්ල විස්තර කරන විට, මගේ හදවත මා තුළ දවෙන්න වුණා.
මටත් එහෙමයි. මුලින්ම මට තේරුනේ නෑ, නුමුත් එතුමා සියල්ල ඉතාමත් පැහැදිලිව දක්වූවා.
මිතුරෙනි, අපට සවන් දෙන්න. මහා ආරංචියක්
පළමුව අපට සවන් දෙන්න. යේසුස් ජීවමානයි, එතුමාණෝ නැඟිට සිටිනවා. එතුමා සීමොන් පේතෘස්ට දර්ශනය වුණා
දන් මට සවන් දෙන්න: අපි එතුමාව අඳුනාගත්තා එතුමා රොටී කැඩූ වෙලාවේ.
හදිසියේම! යේසුතුමා ඔවුන් මැද සිටගත්සේක.
සමාදානය ඔබ සමඟ වේවා! මිතුරෙනි!
මා දකින්නේ කුමක්ද? මේ යේසුතුමාද නැතිනම් මං ආත්මයක් දකිනවාද?
නුඹලා මෙතරම් අවිශ්වාස කරන්නේ මන්ද? මං වාගේ ආත්මයකට මාංසය හා කටු තියෙනවාද?
යේසුතුමා ජීවත්ව ඉන්නවා. කෙතරම් ප්‍රීතියක්ද? එතුමා සැබවින්ම ජීවමානයි!
ඔබෙන් සමහරෙක් තවමත් සැක කරනවා. කන්ට යමක් ඔබ ළඟ තියෙනවාද?
මෙන්න බැදපු මාළු කෑල්ලක්.
ක්‍රිස්තුස්වහන්සේ වධ විඳින්ටත්, මරනු ලබන්ටත්, තුන්වෙනිදා නැගිටිනු ලබන්ටත් ඕනෑ යයි ලියවිල්ලේ ප්‍රකාශ කර තිබේ. නුඹලා සැවොම මෙයට සාක්ෂිකරුවෝය. මුළු ලෝකයේම ශුභාරංචිය ප්‍රකාශ කරන්න.


පාස්කු දිනට පසු දින සවස නැවතනැගිටුනු යේසුතුමා එතුමාගේ ගෝලයින්ට ප්‍රකාශ වූ සේක. සතියකට පසුව ඔවුන් නැවතත් මුණ ගැසුනි.
අන්න තෝමස්, දුක්මුසු කෙනෙක්, පසුගිය සතියේ ඔබ බැහැරවයි සිටියේ.... නැත්නම් ඔබට ජේසුතුමා දගන්න තිබුණා.
අසා නැහැ, නුමුත් එය සත්‍යයක්, එතුමා අප අතරෙහි සිටියා.
යුදෙව්වන්ට... එවිට හදිසියේම යේසුතුමා ඇවිත් අප මැද සිටගත්තා! ඔබ අප සමග සිටියා නම් හොඳයයි අප සිතුවා.
ඔබ සැමගේම මනස අවුල්වෙලා.
ඔබට මා රවටන්න බෑ එවැනි මායාවලින්.
අහන්න, තෝමස්, අපි රහසින් රැස්වුනා. සියලු දොරවල් අගුලු දමා තිබුණා හයින්.....
මට වැටහෙනවා, ඔබට අවසානයක් දකීමට නොහැකියි. ඒ නිසයි....
.....එතුමගේ මරණින් පසුව ඔබ එතුමන්ව සැමතැන දකින්නේ
ඔබේ සිතුවිලි ඔබ සමග ඉවත දුවයි.
තෝමස් අප සිහින දුටුවේ නෑ: එතුමා තමන්ගේ අතේ තුවාල හා පැත්තේ තුවාල අපට පෙන්නුවා. අපි සැබවින් එතුමාව දුටුවා.
නුමුත් ඔබ එතුමාව ඇල්ලුවේ නැහැනේද? ඔබ එය කරන්න තිබුණානේ?
එවිට ඔබට දනගන්න තිබුණා, ඔබ මායාවන් හා විනෝදයෙන් සිටියා. එතුමාගේ අත්වල ඇණ ගැසූ ලකුණු දකින තුරුත්, මගේ ඇඟිල්ල එතුමාගේ ඇලයට බහාලනතුරුත් මං එය විශ්වාස කරන්නේ නැහැ...


හදිසියේම ඔවුන් මධ්‍යයේ යේසුතුමා සිටගෙන ඉන්නවා ඔවුන් දකියි.
සාමය ඔබ සමග වේවා ! මිතුරෙනි !
තෝමස්
මා වෙත එන්න.
දන් නුඹේ ඇඟිල්ල මෙහි දමන්න, මගේ අත් බලන්න.
නුඹේ අත මගේ ඇලයෙහි තබන්න.
සැකය නතර කර විශ්වාස කරන්න.
මාගේ ස්වාමීනී, මාගේ දෙවියනි! මම ඔබ විශ්වාස කරමි.
තෝමස්, නුඹ දුටු නිසා විශ්වාස කළෙහිය. නුදුටු නමුත් විශ්වාස කරන අය ආශිර්වාද ලද්දෝය.


මිතුරෙනී, මං අද
රෑට මාළු
අල්ලන්න යනවා.
අපිත් ඔබ සමඟ
එනවා.
ඒ රාත්‍රියේදී
ඔවුන් කිසිවක්
ඇල්ලුවේ නෑ.
අරුණෝදයේ යේසුතුමා
වෙරළෙහි සිටගෙන
උන්නේය....
මේ (හලෝ), ඔබට
යම්කිසි මාළු
තියෙනවාද?
නෑ, අපි
කිසිවක්
ඇල්ලුවේ
නැහැ.
නියම නරක රැයක් !
අපි හොඳටම විඩාවට
පත්වෙලා, අපි කිසිවක්
ඇල්ලුවේ නෑ.


මා විශ්වාස කරන්න.
නුඹේ දල ඔරුවේ දකුණු පැත්තෙන් හෙලන්න.
එතුමා කුමක්
අපි මේ පැත්තෙන් දල දමන්නට අවශ්‍යයයි.....
එතුමා මාළු පාසලක් දක තිබුණු විය හැකියි
අන්තිම වරට අපි උත්සාහ කරමු. එන්න, තව එක සාරයක්.
දල එළියට විසි කරන්න.
ඒ මනුෂ්‍යයා නිවැරදියි.
මුහුදේ සැම සියළු මාළුන් අපේ දලට පැනලා වගේ......
කොතරම් අති විශාල ඇල්ලීමක්ද
මෙයට මොහොතකට පසු ඔවුන් දල විර්‍යයෙන් අදිමින් සිටියදී......
එයින් මට තවත්මාළු අල්ලීමක් සිහිපත් වෙනවා. බලන්න, පේත්‍රුස්
මෙ හිතුමා හරියි ! ඒ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්


නුඹ හරියි, යොහාන්, එතුමාට පමණයි මේ වාගේ දෙයක් කරන්න පුළුවන්. මට මගේ කබාය දෙන්න, මං වතුරට පනිනවා, එවිට මං ඉක්මණින් එතුමා සමග ඉන්නවා.
යේසුනි, යේසුනී, අපි බව ඇඳින ගත්තෙමු.
ඔබ මාළු ටිකක් රැගෙන එන්න, අපි උදේ ආහාරය කමු.
මට ලොකු මාළු 153 දෙනෙකු ගණන් කළා: එහෙත්දල ඉරුනේ නැහැ.
මම කිසිදාක හිතුවේ නෑ යේසු තුමා අපව මෙහි මුණ ගැසෙයි කියා.
එහෙත් ඒ එතුමා, කොපමණ පුදුමයිද ! දැනගන්න එතුමා සැමවිටම ළඟ ඉන්න බව.

කැමෙන් පසුව....













ඔලීව් කඳු මුදුනේ, යේසුතුමා ස්වර්ගයට යනවා ගෝලයෝ දුටුවෝය. ඒ ආකාරයෙන්ම එතුමා නැවත පැමිණෙයි.

**ඉතා ඉක්මණින්.**

# ඔබ උදෙසා වූ දෙවියන්වහන්සේගේ ප්‍රේමය

මක්නිසාද දෙවියන් වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කලේ උන් - වහන්සේ කෙරහි අදහාගන්න සැමදෙනම විනාශ නොවී සදාකල ජීවනය ලබන පිණිසය. (ශු. යොහන් 3:16)

නුමුත් දෙවියන් වහන්සේ අප කෙරහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම අප වෙනුවට ක්‍රිස්තුස් වහන්සේ මරණය විඳීමෙන්ය. (රෝම 5:8)

මක්නිසාද සියල්ලෝම පව්කොට දෙවියන් වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති. (රෝම 3:23)

මක්නිසාද ඇත්තේ එක දෙවිකෙනෙක් සහ දෙවියන්වහන්සේටත් මනුෂ්‍යයන්ටත් අතරේ එක මැදහත්කාර කෙනෙකුත්ය. (1 තිමෝති 2:5)

යේසුස් වහන්සේ ඔහුට කියනසේක්: මාරගයද සැබෑවද ජීවනයද මමය. මා කරණකොටගෙන මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත. (ශු. යොහන් 14:6)

නුමුත් උන්වහන්සේ ආලෝකයෙහි සිටින්නාසේම අපිත් ආලෝක -යෙහි හැසිරෙමු නම්, අපට එකිනෙකා සමඟ පංගුකාරකම ඇත්තේය. උන්වහන්සේගේ පුත්‍රවූ යේසුස් වහන්සේගේ ලේද සියලු පාපවලින් අප පවිත්‍රකරන්නේය. අපට පාපය නැතැයි කියමු නම්, අපි අපම රවටාගනිමුව. සැබෑවද අප තුළ නැත. අපේ පාවල් කියාදෙමු නම් අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨකව සටිනසේක. අපි පව්කලේ නැතැයි කියමු නම්, (1 යොහන් 1:7-9)

මක්නිසාද ඇදහිල්ල කරණකොටගෙන ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැළවී සිටින්නහුය. එය නුඹලාගෙන්ම නොව දෙවියන් වහන්සේගේ දීමනාවය. කිසිවෙක් පාරට්ටුකර නොගන්න පිණිස ඒක ක්‍රියාවලින් නොවේ. (එපීස 2:8,9)

නුමුත් සුංගම් අය කරන්නා දුරින් සිට, ස්වර්ගය දෙසට ඇස් ඔසවා බලන්ටවත් නොසිතා, තමාගේ ළැපැත්තට ගසාගනිමින්: දෙවියන් වහන්ස, පව්කාර -යෙක්වූ මට කරුණාකළ මැනවයි කීවේය. (ලූක් 18:13)

ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහාගනින්. එවිට නුඹ ගැළවෙන්නෙහිය. නුඹද නුඹේ ගෙයි වැසියෝද එසේමයයි කීවෝය. (ක්‍රියා 16:31)

## යහපත් ආරංචිය නම්ඃ

## යේසුතුමා මළවුන්ගෙන් නැගුටුනු සේක "

## එතුමා ජිවත්ව සිටියි!

යාච්ඤාව :

යේසුතුමනී, මගේ මුළු සිතින් මං විශ්වාස කරනවා
මගේ පව් උදෙසාත් ඔබ තුමා මැරුණු බව.
මගේ සියලු පව් මා කියා දෙන්නෙමි ඔබේ සමාවද අයදිමි.
පැමිණ මගේ සිත තුළ ජීවත්වන්න.
දැන් සිට මාගේ ජීවිතයේ:
මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත ඉටු වේවා.
මාගේ ගැළවුම්කරුවීමට ඔබතුමාට උවමනාවූ නිසා,
මම ඔබට ස්තුති කරමි:

ආමෙන් !

# යකොබ්ගේ සාමාන්‍ය පත්‍රය

## පරීක්ෂාවේදී ස්ථිරව සිටීම පරීක්ෂාව දෙවියන් වහන්සේගෙන් නොවන බව

1 දෙවියන් වහන්සේගෙත් ස්වාමිවූ
යේසුස් ක්‍රිස්තුස් වහන්සේගෙත්
දාසයෙක්වූ, යාකොබ් විසිනි විසිරී
සිටින්නාවූ ගෝත්‍ර දොළොසට ශුභ
සිද්ධවන ලෙස ලියා එවන වග නම්:

2මාගේ සහෝදරයෙනි, නුඹලාගේ ඇද
-හිල්ල සෝදිසිකිරීමෙන් ක්ෂාන්තිගුණය
උපදින බව දන, 3අනේකාකාර පරීක්ෂා
-වට වැටෙන කල, ඒ සියල්ල ප්‍රීතියක්යයි
සිතන්න. 4නුමුත් නුඹලා කිසිවකින් අඩුව
නොසිට සියලු ආකාරයෙන්ම සම්පූර්ණව
සිටින පිණිස ක්ෂාන්තිගුණය සම්පූර්ණ
ලෙස ක්‍රියාකෙරේවා.

5නුමුත් නුඹලාගෙන් යමෙකුට ප්‍රඥාව අඩු
නම්, වරද නොතබන්නාවූ, බොහෝ
කොට සියල්ලන්ට දෙන්නාවූ දෙවියන්
වහන්සේ ගෙන් ඔහු ඉල්ලාවා. එවිට
ඔහුට එය දෙනු ලැබේ. 6නුමුත් අනුමාන
නොකරම ඇදහිල්ලෙන් ඉල්ලාවා. මක්
-නිසාද අනුමානකරන්නා සුළඟින්
ගෙනයන්නාවූ, සෙලවෙන්නාවූ මුහුදේ
රැළට සමානය. 7එබැවින් එබඳු මනුෂ්‍යයා
තමාට ස්වාමීන් වහන්සේගෙන් යමක්
ලැබේයයි නොසිතාවා. 8ඔහු දෙසිත් ඇති
මනුෂ්‍යයෙක්ව තමාගේ සියලු මාර්ගවලදී
අස්ථිරව සිටින්නේය.

9නුමුත් පහත් අඩියක සිටින සහෝදරයා
තමාගේ උසස්වීම ගැනද, 10ධනවතා
තමාගේ පහත්වීම ගැනද පාරට්ටු
කෙරේවා. මක්නිසාද ඔහු තණ මලක්
මෙන් පහවයන්නේය. 11මක්නිසාද
සූර්යයා තද රස්නයෙන් යුක්තව සුළඟින්
උදාවී, තණ කොළ වියළවයි; ඒවායේ
මල් වැටී පෙනීමේ අලංකාරය නැතිවී -
යන්නේය. එසේම ධනවතා තමාගේ
මාර්ගවලදී මැළවී යන්නේය.

12පරීක්ෂාව ඉවසන මනුෂ්‍යයා වාසනා
-වන්තයෙක්ය. මක්නිසාද ඔහු ඒත්තුගනු
ලැබූ කල, තමන්ට ප්‍රේමකරන්නවුන්ට
ස්වාමීන් වහන්සේ විසින් පොරොන්දු
වුණාවූ ජීවනය නම් ඔටුන්න ලබන්-
නේය. 13යමෙක් පරීක්ෂා කරනු ලබන
කල: මම දෙවියන් වහන්සේගෙන්
පරීක්ෂා කරනු ලබමියි නොකියාවා.
මක්නිසාද දෙවියන් වහන්සේ නපුරෙන්
පරීක්ෂා කරනු ලබන්ට නුපුළුවන. උන්-
වහන්සේම කිසිවෙකු පරීක්ෂා නොකරන
සේක. 14නුමුත් එක එක මනුෂ්‍යයා
තම තමාගේ තෘෂ්ණාවෙන් අදිනු ලබන
කල්හිද පොළඹවනු ලබන කල්හිද
පරීක්ෂාකරනු ලබයි. 15එවිට තෘෂ්ණාව
පිළිසිඳගත් කල්හි පාපය බිහිකරන්නීය.
පාපයද සම්පූර්ණවූ කල්හි මරණය
උපදවයි.

16මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි,
නොරැවටෙන්න. සෑම යහපත් දීමද
17සෑම සම්පූර්ණ දීමනාවද කිසි
වෙනස්වීමක්වත් හැරීමේ ඡායාවක්වත්
නැත්තාවූ ආලෝකවල පියාණන්වහන්
-සේ කෙරෙන් ඉහළින් බැස එන්නේය.
18අප උන්වහන්සේගේ මැවිලිවල නාඹුල්

ඵල විශේෂයක් වන පිණිස තමන්ගේම
කැමැත්ත ලෙස සත්‍යයතාවේ වචනයෙන්
අප ඉපදවූසේක.

## සැබෑ ආගම ක්‍රියාවලින් ප්‍රකාශවන බව

19මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි,
නුඹලා මේක දන්නහුය. නුමුත් එක එක
මනුෂ්‍යයා ඇසීමට ඉක්මන් වේවා. කථා
-කිරීමටත් උදහස්වීමටත් ප්‍රමාද වේවා.
20මක්නිසාද මනුෂ්‍යයාගේ උදහසින්
දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨකම ඉෂ්ට
නොවන්නේය. 21එහෙයින් සියලු කිලුටු
-කමද අධි දුෂ්ටකමද පහකොට නුඹලා-
ගේ ප්‍රාණ ගළවන්ට පුළුවන්වූ පිහිටුවන-
කල වචනය මෘදුකමින් යුක්තව පිළි-
ගන්න. 22නුමුත් නුඹලාම රවටාගනිමින්
වචනය අසන්නෝ පමණක් නොවී එය
පිළිපදින්නෝ වෙන්න. 23මක්නිසාද
යමෙක් වචනය අසන නුමුත් එය පිළි-
පදින්නේ නැත්නම්, ඔහු කැඩපතකින්
තමාගේ ස්වභාවික මුහුණ බලන මනුෂ්‍ය-
යෙකුට සමානය. 24මක්නිසාද ඔහු තමාම
බලාගනිමින් සිට අහක්ව ගිය කල තමා
කෙබඳු මනුෂ්‍යයෙක්ව සිටියේදැයි එවලේම
මතක නැති කරයි. 25නුමුත් නිදහස්කමේ
සම්පූර්ණ ව්‍යවස්ථාව දෙස බලාගන
මතක නැතිකරන අසන්නෙක් නොවී
ක්‍රියාකරන කෙනෙක්ව එසේ පවතින්නාවූ
තැනැත්තේම තමාගේ ක්‍රියාකිරීමේදී
ආශිර්වාද තැනැත්තේම තමාගේ ක්‍රියාකිරී
-මෙහිදී ආශිර්වාද ලබන්නේය. 26යමෙක්
තමාගේ දිව යටත්කරන නොගෙන
තමාගේ සිත රවටාගනිමින් තමා භක්ති
-වන්තයෙකැයි සිතන්නේ නම් ඔහුගේ
භක්තිය හිස්ය. 27අපගේ පියවූ දෙවියන්
වහන්සේ ඉදිරියෙහි පිරිසිදුවූ නොකිලුටුවූ
භක්තිය නම් මවුපියන් නැති දරුවන්
වැන්දඹු ස්ත්‍රීන්ද ඔවුන්ගේ විපත්තියේදී
බලාගැනීමත්, ලෝකයෙන් කිලුටු නොවන
ලෙස තමාම ආරක්ෂාකර ගැනීමත්ය.

## සභාවෙහි තරාතිරම් බැලීම නොකටයුතු බව

2 මාගේ සහෝදරයෙනි, අපගේ
තේජවන්ත ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස් වහන්සේගේ ඇදහිල්ල මනුෂ්‍ය
-යන්ගේ තරාතිරම් සැලකීම ඇතුව
නොදරන්න. 2රන් මුද්දක්ද අලංකාර
වස්ත්‍රද පැළඳගන ඉන්න මනුෂ්‍යයෙකුත්
කිලුටු ඇඳුම් ඇඳගන ඉන්න දිළින්දෙකුත්
නුඹලාගේ සිනගෝගයට ආවොත්,
3නුඹලා අලංකාර වස්ත්‍ර පැළඳගන ඉන්න
අය සලකා: මෙහි හොඳ තැනක්
හිඳගන්ටය කියාද දිළින්දාට: නුඹ ඔහේ
සිටින්න නොහොත් මාගේ පාපුටුව ළඟ
ඉඳගන්නැයි කියාද කියනවා නම්,
4නුඹලා භේදවූ අදහස් ඇත්තෝව නපුරු
සිතිවිලිවලින් යුක්ත විනිශ්චයකාරයෝ
නොවන්නෝද? 5මාගේ ප්‍රේමවන්ත
සහෝදරයෙනි අසන්න: ඇදහිල්ලෙහි
ධනවත්වන පිණිසත් තමන්වහන්සේට
ප්‍රේම කරන්නවුන්ට පොරොන්දුවූ රාජ්‍යයේ
උරුමක්කාරයන් වන පිණිසත් දෙවියන්
වහන්සේ ලෝකයේ දිළින්දන් තෝරා
නොගත්සේක්ද? නුමුත් නුඹලා දිළින්දාට
අගෞරවකළහුය. 6ධනවතුන් නුඹලාට
පීඩාකරනවා නොවේද? නඩුශාලාවලට
නුඹලා ඇදගන යනවා නොවේද? 7නුඹලා
දරන උතුම් නාමයට අපහාසකරන්නේ
ඔවුන් නොවේද? 8එසේ වුවත්: නුඹට
මෙන් නුඹේ අසල්වාසියාට ප්‍රේමකරව

යන රාජකීය ව්‍යවස්ථාව ලියවිල්ලේ
හැටියට පවත්වන්නහු නම්: නුඹලා කරන
එක යහපත්ය. 9නුමුත් තරාතිරම් සලක
-න්නෝ නම් නුඹලා වරදකාරයන් බව
ව්‍යවස්ථාවෙන් ඔප්පුවෙන බැවින් නුඹලා
කරන්නේ පාපය. 10මක්නිසාද යමෙක්
මුළු ව්‍යවස්ථාව රක්ෂාකොට එක අණක්
කඩකළේ නම් ඔහු සියල්ල ගැන වරදකා
-රයෙක්වී සිටී. 11මක්නිසාද කාමමිථ්‍යා
-චාරය නොකරවයි කී තැනාන්වහන්සේ:
මිනී නොමරව කියාත් කීසේක. ඉදින්
නුඹ කාමමිථ්‍යාචාරය නොකරන නමුත්
මිනීමරනවා නම්, ව්‍යවස්ථාව කඩකරන්
-නෙක්ව සිටිනෙහිය. 12නිදහස්කමේ
ව්‍යවස්ථාවකින් විනිශ්චයකරනු ලබන්ට
සිටින තැනැත්තන් මෙන් කථාකරන්න
ක්‍රියාකරන්න. 13මක්නිසාද දයාව නො
-පෙන්වූ තැනැත්තාට විනිශ්චය දයාව
නැතුව පැමිණෙන්නේය. දයාව වනාහි
විනිශ්චයට විරුද්ධව ජයනාදකරන්නේය.

## ක්‍රියාවල් නැති ඇදහිල්ල නිෂ්ඵල බව

14මාගේ සහෝදරයෙනි, තමාට ඇදහිල්ල
ඇතැයි යමෙක් කියන නුමුත් ක්‍රියාවල්
නැත්නම් මොන ප්‍රයෝජනයක්ද? ඒ
ඇදහිල්ල නිසා ඔහුට ගැළවෙන්ට
නුපුළුවන්ද? 15සහෝදරයෙක් නොහොත්
සහෝදරියෙක් ඇඳුම් නැතුව දවස්පතා
කෑම නැතුව සිටිද්දී, 16නුඹලාගෙන්
යමෙක්: සමාදානයෙන් යන්න උණුහුම්
වෙන්න කෑම කා තෘප්තියට පැමිණෙන්
-නැයි ඔවුන්ට කියනවා මිස, ශරීරයට
ඕනෑ දේවල් නොදෙනවා නම් මොන
ප්‍රයෝජනයක්ද? 17එසේම ඇදහිල්ල ක්‍රියා
නැතුව තනියම තිබේ නම් මැරීලාය.
18එසේය යමෙක් කථාකොට: නුඹට
ඇදහිල්ල තිබේ මට ක්‍රියාවල් තිබේ. ක්‍රියා
නැතුව නුඹේ ඇදහිල්ල මට පෙන්වන්න.
මම මාගේ ක්‍රියාවලින් මාගේ ඇදහිල්ල
පෙන්වන්නෙමයි කියනවා ඇත. 19ඇත්තේ
එකම දෙවියන් වහන්සේ බව නුඹ
විශ්වාස කරන්නෙහිය. නුඹ කරන එක
හොඳය යක්ෂයොත් විශ්වාසකර වෙවුල
-ති, 20නුමුත් හිස්වූ මනුෂ්‍යය ක්‍රියා නැති
ඇදහිල්ල නිෂ්ඵල බව නුඹ දැනගන්ට
කැමතිද? 21අපේ පියවූ ආබ්‍රහම් තමාගේ
පුත්‍රවූ ඊසාක් පූජාසනය පිට ඔප්පුකළ
විට ක්‍රියාවලින් ධර්මිෂ්ඨකොට ගණන්ගනු
ලැබුවා නොවේද? 22ඇදහිල්ල ඔහු
ක්‍රියාවල් සමඟ ක්‍රියාකළ බවත්, ඇදහිල්ල
ක්‍රියාවලින් සම්පූර්ණවූ බවත් නුඹට
පෙනේ. 23මෙසේ ආබ්‍රහම් දෙවියන් වහන්
-සේ විශ්වාස කෙලේය, එය ධර්මිෂ්ඨකම
කොට ඔහුට ගණන්ගනු ලැබුවේය කියා
තිබෙන ලියවිල්ල සම්පූර්ණවුණේය. තවද
ඔහු දෙවියන් වහන්සේගේ මිත්‍රයායයි
කියනු ලැබුවේය. 24මනුෂ්‍යයෙක් ඇදහිල්ල
පමණකින් නොව ක්‍රියාවලිනුත් ධර්මිෂ්ඨ
කරනු ලබන බව නුඹලාට පෙනෙන්නේය.
25එසේම වේශ්‍යාවවූ රාහබ් පණිවිඩකාර
-යන් පිළිගෙන අන් මගකින් පිටත්කර
ඇරිය කළ ක්‍රියාවලින් ඈ ධර්මිෂ්ඨකරනු
ලැබුවා නොවේද? 26මක්නිසාද ආත්මය
නැති ශරීරය මැරී තිබෙන්නාක්මෙන්ම
ක්‍රියාවලින් වෙන්වූ ඇදහිල්ලද මැරී තිබේ.

## දිව යටත්කරගැනීමේ උවමනාව

**3** මාගේ සහෝදරයෙනි, (ගුරුවරුන්
වන) අපට වඩා බරපතළ
විනිශ්චය පැමිණෙන බව දන බොහෝ
දෙනෙක් ගුරුවරුවෙන්ට නොසොයන්න.

2මක්නිසාද බොහෝ වර අපි සියල්ලෝ
පැකිලෙමුව. යමෙක් වචනයෙන් නොපැකි
-ලේ නම් ඔහු මුළු ශරීරය දමනය
කරන්නට පුළුවන් සම්පූර්ණ මනුෂ්‍ය -
යෙක්ය. 3අශ්වයන් අපට කීකරුකරගන්න
පිණිස උන්ගේ කටවල කටකලියා දමුවාම
අපි උන්ගේ මුළු ශරීරයත් හරවාගනිමුව.
4මෙන්න නැව් එපමණ මහත් නුමුත් තද
හුළංවලින් ගෙනයනු ලබන නුමුත් ඉතා
කුඩා සුක්කානමකින් එය අල්ලන්නා
විසින් කැමති අතට හරවනු ලබයි.
5එලෙසම දිව කුඩා අවයවයක් නුමුත්
ලොකුවට පාරට්ටුකරයි. කුඩා ගින්නකින්
කොපමණ මහත් වනාන්තරයක් පත්තු-
වේනවා නොවිද? දිවද ගින්නක්ය. 6එය
අපේ අවයවයන් අතරේ අධර්මිෂ්ඨකමේ
ලෝකයක්ය. ඒක මුළු ශරීරය කිලුටුකොට
සකල ලෝකයට ගිනි අවුලවයි, ඒකට
ගිනි ඇවිලෙන්නේ නිරයෙන්ය. 7එසේය
සියලු ආකාර වන මෘගයෝද පක්ෂිහුද
බඩගායන ජාතීන් හා මුහුදේ සත්වයෝද
මනුෂ්‍යයන් විසින් දමනයකරනු ලබති.
දමනයකරනු ලැබුවෝය. 8නුමුත් දිව
දමනයකරන්ට කිසි මනුෂ්‍යයෙකුට නුපු-
ළුවන. ඒක කැරළිකාරවූ මරණීය
විෂයෙන් පූර්ණවූ නපුරු දෙයක්ය. 9එයින්
ස්වාමිවූ පියාණන් වහන්සේට අපි
ප්‍රශංසාකරමුව. එයින්ම දෙවියන් වහන්
-සේගේ සමානත්වය ලෙස මවනලද
මනුෂ්‍යයන්ට අපි ශාපකරමුව. 10ප්‍රශංසා
-වත් ශාපයත් එක මුඛයෙන් නික්මෙන්නේ
-ය. මාගේ සහෝදරයෙනි, මේ කාරණා
මෙසේවීම යුතු නැත. 11උල්පත එක
සිදුරෙන් මිහිරි දියත් තික්ත දියත්
නිකුත්කරයිද? 12මාගේ සහෝදරයෙනි,
අත්තික්කා ගහේ ඔලීව ඵලවත්, මුද්‍රික
වැලේ අත්තික්කා ඵලවත් හටගන්ට
පුළුවන්ද? කරදියෙන් මිරිදිය නික්මෙන්ට
නුපුළුවන.

## බොරු ප්‍රඥාව සහ සැබෑ ප්‍රඥාව

13නුඹලා අතරෙහි ප්‍රඥාවන්තවූ, තේරුම්
ඇත්තාවූ තැනැත්තා කවුද? ඔහු යහපත්
හැසිරීමෙන් තමාගේ ක්‍රියා ප්‍රඥාවේ
මෘදුකම ඇතුව පෙන්වාවා. 14නුමුත්
නුඹලාගේ සිත්වල තිත්තක ඊර්ෂ්‍යාවද
පක්ෂවාදිකමද තිබේ නම් පාරට්ටු
කරමින් සත්‍යයට විරුද්ධව බොරු නො-
කියන්න. 15ඒ ප්‍රඥාව ඉහළින් පැමිණෙන
එකක් නොව භූමිකව මාංසිකව යක්ෂා
-කාරව තිබේ. 16මක්නිසාද ඊර්ෂ්‍යාවත්
පක්ෂවාදිකමත් ඇති තැන අවුල්කමත්
සියලු නපුරු ක්‍රියාවලුත් ඇත්තේය.
17නුමුත් ඉහළින් පැමිණෙන ප්‍රඥාව
පළමුකොට පිරිසිදුව ඊළඟට සමාදනව
ඉවසිලිවන්තව යටහත්ව දයාවෙනුත්
යහපත් ඵලවලිනුත් පූර්ණව අපක්ෂවාදීව
අවංකව තිබේ. 18තවද සමාදානකරන්නන්
උදෙසා ධර්මිෂ්ඨකමේ ඵලය සමාදාන
-යෙන් වපුරනු ලැබේ.

## ලෞකිකකමට සහ උඩඟුකමට විරුද්ධව තරවටුකිරීම

4 නුඹලා අතරෙහි යුද්ධත් ඩබරත්
කොයින්ද? ඒවා පැමිණෙන්නේ
නුඹලාගේ අවයවයන් තුළෙහි යුද්ධකරන
නුඹලාගේ තෘෂ්ණාවලින් නොවේද?
2නුඹලා ආශාවන්නහුය, නුමුත් නො -
ලැබෙන්නේය. නුඹලා මිනී මරන්නහුය,
ඊර්ෂ්‍යාවන්නහුය, නුමුත් ලබාගන්ට
බැරිවන්නේය. නුඹලා ඩබරද යුද්ධද

කරන්නහුය. නුඹලා නොඉල්ලන බැවින් නුඹලාට නොලැබෙන්නේය. [3]නුඹලා ඉල්ලන නුමුත් නුඹලාගේ තෘෂ්ණා ගැන වියදම් කරන පිණිස වැරදිලෙස ඉල්ලන බැවින් ලැබෙන්නේ නැත. [4]කාමරම්ථ්‍යා -චාරික තැනැත්තියෙනි, ලෝකය සමඟ මිත්‍රකම දෙවියන් වහන්සේට සතුරුකම බව නුඹලා දන්නේ නැද්ද? එබැවින් කවරෙක් නුමුත් ලෝකයට මිත්‍රවෙන්ට කැමැත්තේ නම් ඔහු දෙවියන් වහන්සේට සතුරෙක් වන්නේය. [5]නොහොත් දෙවියන් වහන්සේ අප තුළ වාසයක කෙරෙවුවාවූ ආත්මය අප කෙරේ අතිශයින් ආශා -වන්නේය කියා ලියවිල්ල නිෂ්කාරණයේ කථාකරන්නේයයි නුඹලා සිතන්නහුද? [6]නුමුත් උන්වහන්සේ වඩා කරුණාව දෙනසේක. ඉන්නිසා දෙවියන් වහන්සේ උඩඟුවූවන්ට විරුද්ධව සිට යටහත්තුන්ට කරුණාව දෙනසේකැයි ලියවිල්ල කියන්-නේය. [7]එබැවින් දෙවියන් වහන්සේට යටත්ව සිටින්න. නුමුත් යක්ෂයාට විරුද්ධව සිටින්න. එවිට ඔහු නුඹලා ඉවතින් පලායනවා ඇත. [8]දෙවියන් වහන්සේට ළංවෙන්න. එවිට උන්වහ -න්සේ නුඹලාට ළංවෙනසේක. පව්කාර -යෙනි, නුඹලාගේ අත් පවිත්‍රකරගන්න. දෙසිත් ඇත්තෙනි, නුඹලාගේ සිත් පිරිසිදුකරගන්න. [9]දුක්වෙමින් වැලපෙමින් හඬන්න නුඹලාගේ සිනාසීම ශෝකයටත් නුඹලාගේ ප්‍රීතිය කණගාටුමටත් හැරේවා. [10]ස්වාමීන් වහන්සේ ඉදිරියෙහි පහත්-වෙන්න. එවිට උන්වහන්සේ නුඹලා උසස් කරන සේක.

[11]සහෝදරියෙනි, එකිනෙකාට විරුද්ධව කථා නොකරන්න. සහෝදරයෙකුට විරුද්ධව කථාකරන්නා නොහොත් තමාගේ සහෝදරයා විනිශ්චයකරන්නා ව්‍යවස්ථාවට විරුද්ධව කථාකරන්නේය. ව්‍යවස්ථාව විනිශ්චය කරන්නේය. ඉදින් නුඹ ව්‍යවස්ථාව විනිශ්චයකරන්නෙහි නම් නුඹ ව්‍යවස්ථාව පවත්වන්නෙක් නොව විනිශ්චයකාරයක්ය. [12]නීතිදායකයාද විනිශ්චයකාරයාද එක්කෙනෙක්ය. එනම් ගළවන්ටත් විනාශකරන්ටත් පුළුවන් තැනැන්වහන්සේය. නමුත් නුඹේ අසල්වා-සියා විනිශ්චයකරන නුඹ කව්ද?

## ධනවතුන්ගේ බැරෑරුම් අදහස්

[13]මෙන්න: අදවත් හෙටවත් අපි අසවල් නුවරට ගොස් එහි අවුරුද්දක් නැතිවී සිට වෙළඳාම්කොට ලාභ උපදවා -ගන්නෙමුයයි කියන්නාවූ තැනැත්තෙනි අසන්න. [14]මක්නිසාද හෙට මක්වේද කියා නුඹලා දන්නේ නැත. නුඹලාගේ ජීවිතය මොකක්ද? නුඹලා ස්වල්ප වේලාවක් පෙනී පසුව නොපෙනී යන මීදුමක්ය. [15]එබැවින්: ස්වාමීන් වහන්සේ කැමති -සේක් නම් අපි ජීවත්ව මේකවත් ඒකවත් කරන්නෙමුයයි නුඹලා විසින් කිය යුතුය. [16]නමුත් දැන් නුඹලාගේ අහංකාර කථා වලින් නුඹලා පාරට්ටුකරන්නහුය. [17]එබැවින් යමෙක් යහපත කරන්නට දැන එය නොකරන්නේ නම් ඔහුට ඒක පාපයක් ය.

# යකොබ්ගේ සාමාන්‍ය පත්‍රය

## ආචාරය

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දාසයෙක්ද
ප්‍රේරිතයෙක්වූද සීමොන් පේතෘස් නම්,
මා විසින් අපේ දෙවිවූ ගැළවුම්කාරවූ
යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ධර්මිෂ්ඨක
-මෙන් අප වාගේ එක සමාන අනර්ඝ
ඇදහිල්ල ලැබුවන්ට ලියා එවන වග
නම්: [2]දෙවියන් වහන්සේද අපගේ දෙවිවූ
ස්වාමී වූ යේසුස් වහන්සේද දැනගැනීමෙන්
අනුග්‍රහයත් සමාදානයත් නුඹලාට වැඩි
වේවා.

## ක්‍රිස්තියානි කාරයන්ගේ චරිත ගුණ හා අභිවර්ධනය

[3]මක්නිසාද තමන්වහන්සේගේ මහිමයෙන්
හා ගුණවන්තකමෙන් අප කැඳවාගත්
තැනැන්වහන්සේ දැනගැනීම කරණකොට
ගෙන උන් වහන්සේගේ දිව්‍ය බලයෙන්
ජීවිතයටත් දේව භක්තියටත් අදාළවූ
සියලු දේ අපට දී තිබේ. [4]ඒ කරණකොට
ගෙන උන්වහන්සේ තමන් අනර්ඝවූ ඉතා
උතුම්වූ පොරොන්දු අපට දී තිබේ. එසේ
කළේ තෘෂ්ණාව නිසා ලෝකයේ තිබෙන
දූෂ්‍යකමෙන් නුඹලා ගැළවී, ඒ පොරොන්දු
කරණකොටගෙන දේව ස්වභාවයට
පංගුකාරයන් වන පිණිසය. [5]එසේය,
මේ කාරණය නිසාම මුළු උත්සාහයෙන්
නුඹලාගේ ඇදහිල්ල සමහ ගුණයද,
ගුණය සමහ දැනගැන්මද, [6]දැනගැන්ම
සමහ පමණ දැන ක්‍රියාකිරීමද, පමණ
දැන ක්‍රියාකිරීම සමහ ඉවසිල්ල, ඉවසිල්ල
සමහ දේවභක්තියද, [7]දේවභක්තිය සමහ
සහෝදර ස්නේහයද, සහෝදර ස්නේහය
සමහ ප්‍රේමයද සපයාගන්න. [8]මක්නිසාද
මේවා නුඹලාට තිබේ නම්, වැඩිවේ නම්
අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ
දැන ගැනීමෙහි කම්මැළි බවටවත්, අඵල
බවටවත් පැමිණෙන්ට ඒවා නුඹලාට ඉඩ
නොදෙයි. [9]නුමුත් මේවා නැති තැනැත්තේ
තමාගේ පරණ පව්වලින් පවිත්‍ර කරනු
ලැබූ බව මතක නැතිකොට ළඟ තිබෙන
දේ පමණක් බලමින් අන්ධව සිටියි.
[10]එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ
කැඳවීමද තෝරාගැනීමද, ස්ථිරකරගන්න
පිණිස වඩා කඩිසරව ක්‍රියාකරන්න.
මක්නිසාද නුඹලා මේ දේ කරනවා නම්
කිසි කලකත් පැකිලෙන්නේ නැත.
[11]මක්නිසාද මෙසේ අපගේ ස්වාමිවූ
ගැළවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ-
ගේ සදාකාල රාජ්‍යයට ඇතුල්වීම නුඹලාට
බොහෝසේ දෙනු ලැබේ.

## ප්‍රේරිත තැනගේ මරණය ළඟ බව දැනුම්දීම

[12]එබැවින් නුඹලා මේ දේවල් දැන නුඹලාට
තිබෙන සත්‍යතාවෙහි පිහිටා සිටින නුමුත්
මම නුඹලාට මේ දේවල් සිහිකරවන්ට
නිතර සූදානම්ව සිටිමි. [13]අපගේ දෙවිවූ
ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මට
පෙන්වූ ලෙසම මාගේ කූඩාරම පහකර
දමීමේ කාලය වහාම පැමිණෙන බව
දැන, [14]මම මේ කූඩාරමෙහි සිටින තුරු
නුඹලාට සිහිකරවීමෙන් නුඹලා පුබුදු -
වන්ට යුතුයයි සිතමි. [15]එසේය, මාගේ
ඇවෑමෙන් පසු, නුඹලාට මේ දේවල්
හැම කල්හිම සිහිකරගන්ට පුළුවන්වන
පිණිස කඩිසරව ක්‍රියා කරන්නෙමි.

## පේතෘස් තුමාගෙන් ප්‍රොපේතවරුන්ගේ සාක්ෂි

[16]මක්නිසාද අපගේ ස්වාමිවූ යේසුස්
ක්‍රිස්තුස් වහන්සේ බලයත්, ඊමත්, අපි
නුඹලාට දන්වූ කළ, උන්වහන්සේගේ
මහිමය ඇසින් දකලා මිස ප්‍රයෝගයෙන්
යොදන ලද ප්‍රබන්ධ අනුව එසේ
නොකෙළෙමුව. [17]මක්නිසාද මොහු මාගේ
ප්‍රේමවන්ත පුත්‍රයාය. මොහු කෙරෙහි මම
ප්‍රසන්නව සිටිමියි යන හඬක් උත්කෘෂ්ඨ
තේජසෙන් උන්වහන්සේ කරා පහළවූ
කල්හි පියවූ දෙවියන් වහන්සේගෙන්
ගෞරවයත් තේජසත් උන්වහන්සේ ලැබූ
සේක. [18]උන්වහන්සේ සමඟ ශුද්ධ වූ
කන්දේ සිටියදී මේ හඬ ස්වර්ගයෙන්
එනවා අපිම ඇසීමුව. ඊට වඩා ස්ථිර
කරන ලද්දාවූ අනාගතවාක්‍යය අපට
තිබේ. [19]ලියවිල්ලේ කිසි අනාගත
වාක්‍යයක් යමෙකුගේ අභිප්‍රායෙන්ම හට
නොගන්න බව පළමුකොට දැන, [20]අලුයම
පැමිණ පහන් තාරකාව නුඹලාගේ සිත්
තුළෙහි පායනතුරු අඳුරු තැනක බබළන
පහනක්මෙන් එය සලකන්නහු නම්
යහපත්ය. [21]මක්නිසාද කිසි අනාගත
වාක්‍යයක් මනුෂ්‍ය කැමැත්තෙන් කිසි
කලක නොපැමිණෙයේය. නුමුත් මනුෂ්‍ය
-යෝ ශුද්ධාත්මයාණන් විසින් පොළඹවනු
ලැබ, දෙවියන් වහන්සේගෙන් ලැබූ ලෙස
කළාකළෝය.

## බොරුවූ මාංසිකවූ අහංකාරවූ ගුරුවරුන් සම්බන්ධ තර්ජන

නුමුත් සෙනඟ අතරේ බොරු ප්‍රොපේත
-වරුද සිටියෝය. එලෙසම විනාශක
ධර්මභේද රහසින් උපදවමින් ද, තමුන්ම
මිලේටගත් ආචාරීන්වහන්සේව එපා
කරමින්ද තමුන් පිටට ශීඝ්‍ර විනාශය
පමුණුවාගන්නාවූ බොරු ගුරුවරුන්
නුඹලා අතරෙන් වන්නෝය. [2]ඔවුන්ගේ
සල්ලලකම් අනුව බොහෝ දෙනෙක්
යනවා ඇත. ඔවුන් නිසා සත්‍යතාවේ
මාර්ගයට අපහාස පැමිණෙන්නේය.
[3]තණ්ඩහාව නිසා ඔවුන් වංචා වචන
වලින් නුඹලා වෙළඳාමක් කරගන්නවා
ඇත. පුරාණයේ සිට පවතින ඔවුන්ගේ
විනිශ්චය ප්‍රමාද නොවන්නේය. ඔවුන්ගේ
විනාශයද නිදා නොගනියි. [4]මක්නිසාද
දේවදූතයන් පව්කළ විට දෙවියන් වහන්
-සේ ඔවුන්ට දඬුවම් නොකර නැර
විනිශ්චය පිණිස ඉතිරි කොට තැබීමට
නිරයෙහි හෙළා, අන්ධකාරයේ ගුහාවලට
භාරදුන්සේක් නම්, [5]උන්වහන්සේ අභක්
-තීන්ගේ ලෝකය පිට ජලගැලීමක්
පැමිණෙවූ කල පුරාණ ලෝකය ඉතිරි
නොකොට ධර්මිෂ්ඨකමේ දේශනාකාර
-යෙක්වූ නෝවා තවත් සත්දෙනෙකුත්
සමඟ ආරක්ෂාකළසේක් නම්, [6]සොදොම
හා ගොමොරාව යන නුවරවල් අළු
කරමින් ඒවා පෙරළා දමා, විනාශයට
නියමකොට මතු අභක්තික ලෙස හැසි
-රෙන්නන්ට ඒවා ආදර්ශයක් කළ සේක්
නම්, [7]දුෂ්ඨයන්ගේ සල්ලාල ජීවිතය
කරණකොටගෙන තද පීඩාවට පැමිණියා
වූද, [8]ඔවුන් අතරෙහි වසමින් ඔවුන්ගේ
අයුතු ක්‍රියාවන් දවසින් දවස දැකීමෙනුත්
ඇසීමෙනුත් තමාගේ ධර්මිෂ්ඨ ආත්මයට
දැඩි දුක් පමුණුවාගත්තාවූද, ධර්මිෂ්ඨවූ
ලෝක ගැළවූසේක් නම්, [9]භක්තිවන්තයන්
පරීක්ෂාවෙන් ගළවන්ටත් අධර්මිෂ්ඨයන්
ප්‍රධානකොට කිලුටුකමේ තෘෂ්ණාවෙන්
මාංසය අනුව හැසිරෙන්නාවූ අධිපතිකමට

අපහාස කරන්නාවූ අය, [10]දඬුවම යටතේ
විනිශ්චය දවස දක්වා තබන්ටත්,
ස්වාමීන් වහන්සේ දන්නා සේක. භය
නැත්තාවූ හිතුවක්කාරවූ, මොව්හු උත්ත-
මන්ට නින්දාකරන්ට තැති නොගනිති.
[11]එහෙත් දේවදූතයෝ පරාක්‍රමයෙන්ද
බලයෙන්ද වඩා උතුම් නුමුත්, ස්වාමීන්
වහන්සේ ඉදිරියෙහි ඔවුන්ට විරුද්ධව
නින්දා සහිත විනිශ්චයක් නොපමුණුවති.
[12]නුමුත් අල්ලා විනාශකරනු ලබන්ට
උපන් ජම්මයෙන් නුවණ නැත්තාවූ
තිරිසනුන් මෙන් මොව්හු නොදන්නා දේට
අපහාස කරමින් අධර්මිෂ්ඨකමේ කුලිය
ලබමින් තමුන්ගේම කිලිටුකමෙන් සැබවින්
විනාශවන්නෝය. [13]ඔව්හු දවාලෙහි ක්‍රීඩා
සෝෂාව ප්‍රීතියක්යයි සලකති. ඔව්හු ලප
හා කැලැල්ව සිටිති. [14]ඔව්හු නුඹලා
සමඟ මංගල්‍ය පවත්වන අතර තමුන්ගේ
මංගල්‍යවලදී ක්‍රීඩා සෝෂා පවත්වති.
ඔව්හු කාමමිථ්‍යාචාරයෙන් පිරුණාවූ
පාපයෙන් වළකින්ට නුපුළුවන් ඇසි
ඇත්තෝය. ඔව්හු අස්ථිර ආත්ම පොළඹ
-වන්නෝය. තණ්හාවට පුරුදු සිතක්
ඇත්තෝය. ශාපයේ දරුවෝය. [15]ඔව්හු
හරි මාර්ගය අත් හැර අයුතුකමේ කුලියට
කැමතිවූ බෙයෝර්ගේ පුත්‍රවූ බාලාම්ගේ
මාර්ගය අනුව මුළාව ගියෝය. [16]නුමුත්
ඔහු තමාගේම අපරාධය ගැන තරවටු
කරනු ලැබුවේය. ගොළු කොටළුවෙක්
මනුෂ්‍ය හඬින් කථාකොට අනාගතවක්තෘ
ගේ උමතුව වැළැක්වූයේය. [17]ඔව්හු වතුර
නැති උල්පත්ය. තද සුළඟින් ගසාගනයන
මීදුම්ය. ඔවුන්ට අන්ධකාරයේ කළුවරකම
ඉතුරුකර තබා තිබේ. [18]මක්නිසාද ඔව්හු
නිෂ්ඵලකමේ මහත් ආඩම්බර වචන
කථාකරමින් වරදෙහි වසන්නන් කෙරෙන්
යන්තම් ගැළවීයන්නන් මාංසයේ තෘෂ්ණා
-ව වන සල්ලාලකමෙන් ඇදගනියිති.
[19]ඔව්හු තුමූම දූෂ්‍යකමේ දාසයන්ව සිටින
අතර ඔවුන්ට නිදහස දෙන්ට පොරොන්දු
-වෙති. [20]මක්නිසාද යමෙක් යමෙකුගෙන්
පරාජයවූණොත්, ඔහු ඒ තැනැත්තාට
වහල්ව සිටියි. මක්නිසාද ස්වාමීවූ
ගැළවුම්කාර වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ
-ව දැනගැනීමෙන් ලෝකයේ කිලුටුකම්
වලින් මිදුණායින් පසු, ඔවුන් නැවත
ඒවාට පටලැවී වහල්වුණොත් ඔවුන්ගේ
පළමු ස්වභාවයට වඩා අන්තිම ස්වභාව
නපුරු වන්නේය. [21]මක්නිසාද ඔවුන්
ධර්මිෂ්ඨකමේ මාර්ගය දැනගත්තායින්
පසු ඔවුන්ට භාරදුන් ශුද්ධවූ ආඥාවෙන්
හැරීයනවාට වඩා ඒ මාර්ගය දැන
නොගන්නා නම් ඔවුන්ට යහපත්ය.
[22]බල්ලා නැවත උගේ වමනයටත්, නැවාවූ
ඊරී මඩේ පෙරළීමටත් හැරී ගියෝය යන
සැබෑ උපමාවේ ප්‍රකාරයට ඔවුනට සිදුවී
තිබේ.

## ස්වාමීන් වහන්සේගේ ඊම ප්‍රමාද වන නුමුත් සන්තක බව

ප්‍රේමවන්තයෙනි, දැන් මේක මා නුඹලාට
ලියා එවන දෙවෙනි ලියුමය. [2]ශුද්ධවූ
අනාගතවක්තෘවරුන් විසින් පළමුවෙන්
කියනලද වචනද, නුඹලාගේ ප්‍රේරිතයන්
කරණාගෙන කියෙවූ ස්වාමිවූ ගැළවුම්
-කාරයාණන්ගේ ආඥාවද නුඹලාට
මතක්වෙන පිණිස මතක්කරවීම කරණ
-කොටගෙන නුඹලාගේ අවංකවූ සිත්
මේ ලියුම් දෙකින්ම පුබුදුකරනම්. [3]අන්තිම
දවස්වලදී තමුන්ගේ තෘෂ්ණා ලෙස හැසි
-රෙන්නාවූ, [4]පියවරුන් සැතපුණු පසු
මැවීමේ පටන්ගැන්මේ සිට සියලු දේ
තිබුණාක්මෙන් පවතින බැවින් උන්-
වහන්සේගේ ඊමේ පොරොන්දුව කොතැන්

-හිදැයි සරදරම්කරමින් කියන්නාවූ කවට
-කම්කරන්නෝ පැමිණෙන්නෝයයි
පළමුකොට දැනගන්න. [5]මක්නිසාද
දෙවියන් වහන්සේගේ වචනය කරණා
කොටගෙන පුරාණයේ පටන් අහසක්ද
වතුරෙන් සම්බන්ධකරන ලද්දාවූ වතුර
මධ්‍යයෙහි වූ පොළොවක්ද තිබුණු බවත්,
[6]ඒ කරණාකොටගෙන එකලට තිබුණු
ලෝකය ජලගැල්මට යටවී විනාශවූ බවත්
ඔව්හු කැමැත්තෙන්ම මතකනැතිකරති.
[7]නුමුත් දැන් පවතින අහසද පොළොවටද
එම වචනයෙන් විනිශ්චයෙන් අභක්තික
-යන්ගේ විනාශයෙත් දවස දක්වා
ඉතුරුක්රනු ලැබ ගින්නෙන් දැවීමට තබා
තිබේ.
[8]නමුත් ප්‍රේමවන්තයෙනි, ස්වාමීන් වහන්
-සේට එක දවසක් අවුරුදු දහසක්
මෙන්ය. අවුරුදු දහසක් එක දවසක්
මෙන්ය යන මේ එක කාරණය මතකනැති
නොකරන්න. [9]ප්‍රමාදය, සමහරු සලකන
හැටියට ස්වාමීන් වහන්සේ තමන්ගේ
පොරොන්දුව ගැන ප්‍රමාද නොවන සේක..
නුමුත් සියල්ලම පසුතැවිලිවෙනවාට මිස
කිසිවෙක් විනාශයවෙනවාට උන්වහන්සේ
නොකැමැතිව නුඹ කෙරෙහි බොහෝ කල්
ඉවසන සේක. [10]එහෙත් සොරෙකුමෙන්
ස්වාමීන් වහන්සේගේ දවස පැමිණෙන්නේ
-ය. ඒ දවසේදී අහස මහත් ඝෝෂාවකින්
පහවයන්නේය. මහා භූතයෝද, තද
උෂ්ණයෙන් නාස්තිවී යන්නෝය. පොළෙව
-ද එහි තිබෙන කාර්මාන්තද දාලා
යන්නේය.

## සූදානම්ව සිටීමේ උවමනාව

[11]මේ සියල්ල මෙසේ නාස්තිවෙන්ට තිබෙ
-න බැවින් නුඹලා දෙවියන් වහන්සේගේ
ද වස පැමිණීම බලාසිටිමින්ද, ඒ ගැන
උන්නදුව ක්‍රියාකරමින්ද, සියලු ආකාර
ශුද්ධවූ හැසිරීමෙහිත් භක්තිවන්තකමෙහිත්
කොයි ආකාර අයවල්ව සිටින්ට ඕනැද?
[12]ඒ නිසා අහස ගිනි ඇවිලී නාස්ති
වෙනවා ඇත. මහාභූතයෝද දාලා උණුවී
යන්නෝය. [13]එහෙත් ධර්මිෂ්ඨකම වාසය
කරන අලුත් අහසක්ද, අලුත් පොළොවක්
ද, උන්වහන්සේගේ පොරොන්දුවේ
හැටියට අපි බලා සිටිමුව. [14]ඉන්නිසා
ප්‍රේමවන්තයෙනි, නුඹලා මේ දේවල් බලා
සිටින බැවින් උන්වහන්සේ ඉදිරියෙහි
කැලැල් රහිතව නිදොස්ව සමාදානයෙන්
යුක්තව දකිනු ලබන පිණිස උත්සාහ
කරන්න. [15]අපේ ප්‍රේමවන්ත සහෝදරවූ
පාවුල්ද තමාගේ දුන් ප්‍රඥාව ලෙස
නුඹලාට ලියා එවූවාක්මෙන් අපගේ
ස්වාමීන් වහන්සේගේ ඉවසිලිවන්තකම
ගැළවීමයයි සලකන්න. [16]එමෙන්ම සියලු
ලියුම්වලත් ඔහු මේ දේවල් ගැන කථාකර
තිබේ. එහි තේරුම්ගන්ට අමාරු සමහර
දේ තිබේ නුගත් අස්ථිර තැනැත්තෝ
අන් ලියවිලිමෙන් තමුන්ගේම විනාශයට
ඒවාත් පෙරළති. [17]එබැවින් ප්‍රේමවන්ත
-යෙනි, නුඹලා මේ දේවල් කල්හි දැනගත
සිටින බැවින් දුෂ්ඨයන්ගේ මුළාවෙන් ඇදී
ගොස් නුඹලාගේම ස්ථිරභාවයෙන්
නොවැටෙන පිණිස පරෙස්සම්වෙන්න.
[18]එහෙත් අපගේ ස්වාමිවූ ගැළවුම්කාරවූ
යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ කරුණා
-වෙහිද උන්හන්සේ දැනගැන්මෙහිද
වර්ධනය වෙන්න. දැනටත් සදාකාලයටත්
උන්වහන්සේ ගෞරවය වේවා. ආමෙන්

# 1 කොරින්ති

## යේසුස් වහන්සේගේ නැවත නැගිටීම උන්වහන්සේ කරණකොටගෙන වූ මළවුන්ගේ නැගිටීම

තවද සහෝදරයෙනි, මම නුඹලාට
දේශනා කළාවූ නුඹලා පිළිගත්තාවූ
නුඹලා පිහිටා සිටින්නාවූ, 2නුඹලා
ගැළවීමට පැමිණෙවූවාවූ ශුභාරංචිය
නුඹලාට දන්වමි. මා නුඹලාට ප්‍රකාශ
කළ කාරණා නුඹලා අල්ලාගෙන
සිටින්නහු නම්, කුමන වචවලින් එය
නුඹලාට දේශනාකෙළෙම්දැයි දන්වමි.
නැත්තේ නම් නුඹලා නිෂ්ඵලෙස ඇදහුවහු
ය. 3ඉතින් මාත් ලබාගත් දේ සියල්ලට
පළමුවෙන් නුඹලාට භාරදුනිමි. එනම්
ලියවිලිවල ප්‍රකාරයට අපේ පව් නිසා
ක්‍රිස්තුස් වහන්සේ මැරුණු බවත් 4උන්
-වහන්සේ තැන්පත් කරනු ලැබූ බවත්
ලියවිල්වල ප්‍රකාරයට තුන්වෙනිදා උන්
-වහන්සේ නැගිටුවනු ලැබූ බවත්
5කේපස්ටද පසුව දොළොස්දෙනාටද
පෙනුණු බවත් ය. 6ඉන්පසු උන්වහන්සේ
එකවිටම පන්සියයකට වඩා සහෝදර
-යන්ට පෙනුණුසේක. ඔවුන්ගෙන්
වැඩිදෙනා මේ දක්වා සිටිති. සමහරු
සැතපුණෝය. 7ඉන්පසු උන්වහන්සේ
යාකොබ්ටද, පසුව සියලු ප්‍රේරිතයන්ටද
පෙනුණුසේක. 8සියල්ලන්ට පසු අකලට
උපන් තැනැත්තෙක් වැනිවූ මටත් උන් -
වහන්සේ පෙනුණුසේක. 9මක්නිසාද මම
ප්‍රේරිතයන්ගෙන් ඉතා කුඩා තැනැත්තාය.
මම දෙවියන් වහන්සේගේ සභාවට පීඩා
කළ බැවින් ප්‍රේරිතයෙකැයි කියනු ලබන්ට
නොවටිමි. 10නුමුත් මම යම් ස්වභාවය
-කට පැමිණ සිටිම්ද, එසේ සිටින්නේ
දෙවියන් වහන්සේගේ අනුග්‍රහයෙන්ය.
උන්වහන්සේ මට දුන් අනුග්‍රහය නිෂ්ඵල
නොවීය. මම ඔවුන් සියල්ලන්ට වඩා
බොහෝසෙයින් වැඩකළෙමි. නුමුත් එසේ
කළේ මා නොව මා කෙරෙහි තිබුණාවූ
දෙවියන් වහන්සේගේ අනුග්‍රහයය.
11එබැවින් මා වුණත් ඔවුන් වුණත්, එසේ
අපි දේශනාකරමුව. එසේ නුඹලා අදහා
-ගත්තහුය.

12ඉදින් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන්
නැගුටුවනු ලැබූසේකැයි දේශනාකරනු
ලැබේ නම්, මළවුන්ගේ නැගිටීමක් නැතැයි
නුඹලා අතරෙන් සමහරුන් කියන්නේ
කොහොමද? 13මළවුන්ගේ නැගිටීමක්
නැත්නම්, ක්‍රිස්තුස් වහන්සේත් නැගුටුවනු
නොලැබූසේක. 14ඉදින් ක්‍රිස්තුස් වහන්සේ
නැගුටුවනු නොලැබූසේක් නම්: අපගේ
දේශනාකිරීම නිෂ්ඵලය. නුඹලාගේ
ඇදහීමත් නිෂ්ඵලය. 15එසේය, මළවාහු
නැගුටුවනු නොලබත් නම්, දෙවියන්
වහන්සේ විසින් නොනැගිටෙවූවාවූ,
ක්‍රිස්තුස් වහන්සේව උන්වහන්සේ නැගි
-ටෙවූ සේකැයිද, අපි උන්වහන්සේ ගැන
සාක්ෂිදුන් බැවින් අපත් දෙවියන්
වහන්සේ ගැන බොරු සාක්ෂිකාරයන්
බව පෙනේ. 16මක්නිසාද මළාවූ නැගුටුවනු
නොබත් නම් ක්‍රිස්තුස් වහන්සෙත් නො
-නැගුටුසේක. 17ඉදින් ක්‍රිස්තුස් වහන්සේ
නොනැගුටුණුසේක් නම්, නුඹලාගේ
අදහීම නිෂ්පලය. නුඹලා මේ දක්වා
නුඹලගේ පාපවල සිටින්නහුය. 18එපම-

ණක් නොව ක්‍රිස්තුස් වහන්සේ කෙරහි
සැතපුණු අයට විනාශවුණෝ වෙති.
[19]ක්‍රිස්තුස් වහන්සේ තුළ අපට බලා -
පොරොත්තුව තිබෙන්නේ මේ ජීවිතය
ගැන පමණක් නම් අපි සියලු මනුෂ්‍ය -
යන්ට වඩා අනුකම්පා ලැබිය යුත්තෝය.

[20]නුමුත් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන්
නැගිට සිටිනසේක්මය. උන්වහන්සේ
සැතපී ඉන්නන්ගේ නාඹුල් ඵලයය.
[21]මක්නිසාද මනුෂ්‍යයෙකු කරණකොට
-ගෙන මරණය පැමුණුණ බැවින් මනුෂ්‍ය
-යෙකු කරණකොටගෙන මළවුන්ගෙන්
නැගිටීමත් පැමුණුනේය. [22]මක්නිසාද
ආදම් තුළ සියල්ලන් මැරෙන්නාක් මෙන්ම
ක්‍රිස්තුස් වහන්සේ තුළ සියල්ලෝම ජීවත්
-කරනු ලබන්නෝය. [23]නුමුත් එක් එක්
අය තම තමාගේම ක්‍රමයෙන්ය. ක්‍රිස්තුස්
වහන්සේ නාඹුල් ඵලයය. ඉන්පසු ක්‍රිස්තුස්
-වහන්සේගේ ඊමේදී උන්වහන්සේ
සන්තකවූවෝ (නැගිටින්නෝ)ය. එවිට
කළෙවර පමිණේ [24]උන්වහන්සේ සියලු
අධිපතිකම්ද බලයද පරාක්‍රමයද නැතිකළ
කල්හි උන්වහන්සේ රාජයය පියවූ
දෙවියන් වහන්සේට භාරදෙන සේක.
[25]මක්නිසාද උන් වහන්සේ සියලු සතුරන්
තමන්වහන්සේගේ පාදයට දමන තුරු
රජකම්කරන්ට ඕනෑය. [26]නැතිකරනු
ලබන්නාවූ අන්තිම සතුරා නම් මරණයය.
[27]මක්නිසාද දෙවියන් වහන්සේ උන් -
වහන්සේගේ පාදවලට සියල්ල යටත්කළ
සේක. එහෙත් සියල්ල යටත්කරනු
ලැබූවේයයි උන්වහන්සේ කියන කල,
සියල්ල උන්වහන්සේට යටත් කළ තැනැත්
-වහන්සේ අයත් නැති බව පැහැදිලිය.
[28]තවද සියල්ල උන්වහන්සේට යටත්
කරුනු ලැබුවාම, දෙවියන් වහන්සේ
සියල්ල තුළ සියල්ල වන පිණිස පුත්‍ර-
යාණන් වහන්සේත් තමන්ට සියල්ල
යටත්කළ තැනැනවහන්සේට යටත්වන
සේක.

[29]ඇරත් මළවුන් උදෙසා බව්තීස්මකරනු
ලැබූ අය කුමක් කරන්නෝද? මළාහු
කිසිසේත් නැගුටුවනු නොලබන්නෝ නම්
කුමක්හෙයින් ඔවුන් උදෙසා බව්තීස්ම
කරනු ලබන්නෝද? [30]අපිත් කුමක්හෙයින්
සෑම වේලේම අන්තරායෙහි සිටිමුද?
[31]සහෝදරයෙනි, මම දවස්පතා නසිමියි
අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ
තුළ නුඹලා ගැන මට ඇත්තාවූ පාරට්ටුව
පිට කියමි. [32]මම එපීසයේදී මනුෂ්‍යයාකාර
-යන් මෘගයින් සමහ පෙරබදීම් නම්
මට ඇති ප්‍රයෝජනය කුමක්ද? මළාහු
නොනැගිටිත් නම්, හෙට මැරෙන බැවින්
කමු බොමු. [33]නොවටෙත්න නපුරු
සමාගමෙන් හොඳ චරිත නරක්වන්නේය.
[34]ධාර්මික ලෙස පිබිද පව් නොකර
සිටින්න. මක්නිසාද සමහරු දෙවියන්
වහන්සේ ගැන දැනුම නැතුව සිටිති.
නුඹලා ලජ්ජාවට පමුණුවන පිණිස මෙසේ
කියමි.

[35]නුමුත් මළවුන් නැගිටින්නේ කෙසේද?
ඔව්හු කොයි ප්‍රකාර ශරීරයක් ඇතුව
එද්දැයි යමෙක් අසනවා ඇත. [36]අඥානය
නුඹම වපුරන දේ මළොත් මිස නැත්නම්
පැළවෙන්නේ නැත. [37]නුඹ වපුරන කල
පවුරන්නෙත් මතු අටගන්න කඳ නොව
තිරිඟු හෝ වෙන වර්ගයක බීජයක් හෝ
පමණය. [38]නුමුත් දෙවියන් වහන්සේ
තමන් කැමතිවූ හැටියට ඊට කඳක්ද,

එක එක බීජයට නියමවූ කඳක්ද
දෙනසේක. [39]සියලු මාංස එකාකාර
මාංස නොවේ. මනුෂ්‍යයන්ගේ මංසය
එක් ආකාරයක මෘගයන්ගේ මාංසය
වෙන ආකාරයක පක්ෂීන්ගේ මාංසය.
තවත් ආකාරයක මසුන්ගේ මාංසය
වෙනත් ආකාරයක. [40]ස්වර්ගීක ශරීරද
භූමික ශරීරද ඇත්තාහ. නුමුත් ස්වර්ගී-
කයන්ගේ තේජස එකක් ය. භූමිකයන්ගේ
තේජස අනික්ය. [41]සූර්යයාගේ තේජස
එකක්ය චන්ද්‍රයාගේ තේජස අනිකක්ය.
තාරකාවන්ගේ තේජස තවත් එකක්ය.
මක්නිසාද දේජසින් තාරකාවක් තාරකා-
වට වෙනස්ය. [42]මළවුන්ගෙන් නැගිටීමත්
එසේමය. ජරාවෙන් යුක්තව වපුරනු
ලැබේ. ජරාවෙන් වියුක්තව නැඟුටුවනු
ලැබේ. [43]අගෞරයෙන් යුක්තව වපුරනු
ලැබේ. තේජසින් යුක්තව නැඟුටුවනු
ලැබේ. දූර්වලකමෙන් යුක්තව වපුරනු
ලැබේ. බලයෙන් යුක්තව නැඟුටුවනු
ලැබේ. [44]ස්වාභාවික ශරීරයක්ව වපුරනු
ලැබේ. ස්වාභාවික ආත්මික ශරීරයක්ව
නැගුටුවනු ලැබේ. ස්වාභාවික ශරීරයක්
තිබේ නම්, ආත්මික ශරීරයක්ද තිබේ.
[45]එසේම, පළමුවෙනි මනුෂ්‍යයාවූ ආදම්
ජීවමාන ප්‍රාණයක් වූණේයයි ලියා තිබේ.
අන්තිමය ආදම් ජීවනදායක ආත්මයක්
විය. [46]එසේවී නුමුත් ප්‍රථමවන්නේ
ආත්මික එක නොව ස්වාභාවික එකය.
පසුව ආත්මික එකවිය. [47]පළමුවෙනි
මනුෂ්‍යයා භූමියෙන් ය භූමිකය දෙවෙනි
මනුෂ්‍යයා ස්වර්ගයෙන්ය. [48]භූමික තැනැ-
ත්තා යම්සේද භූමිකයෝත් එසේමය. [49]අපි
භූමිකවූ තැනැත්තාගේ රූපය දැරුවා සේම
ස්වර්ගීක තැනැත්තාගේ රූපයද දරන්නෙ-
මුව.

[50]ඉතින් සහෝදරයනි, මාංසයට හා
රුධිරයට දෙවියන් වහන්සේගේ රාජ්‍යය
උරුමකරගන්ට බැරි බවත් දිරන ස්ව-
භාවට නොදිරන ස්වභාව උරුමකර
ගන්ට බැරි බවත් කියමි. [51]මෙන්න
නුඹලාට රහසක් කියමි. අපි සියල්ලෝම
නොසැතපෙන්නෙමුව. නුමුත් අන්තිම
හොරණෑව පිඹින කල මොහොතකින්
[52]ඇසිපිය හෙළන ක්ෂණයකින් අපි
සියල්ලෝම වෙනස්කරනු ලබන්නෙමුව.
මක්නිසාද හොරණෑව පිඹිනු ලබන්නේය.
එකල මළාහු නොදිරන ස්වභාවයෙන්
යුක්තව නැඟුටුවනු ලබන්නෝය. අපිද
වෙනස්කරනු ලබන්නෙමුව. මක්නිසාද
අපිද වෙනස්කරනු ලබන්නෙමුව. [53]මක්නි
-සාද දිරන සුලුවූ මේක නොදිරන බවට
පැමිනේනට ඕනෑය. මරණීයවූ මේක
අමරණීයභාවයට පැමිණෙන්ට ඕනෑය.
[54]දිරන සුලුවූ මේක නොදිරන භාවයටත්
මරණීයවූ, මේක අමරණීයභාවයටත්
පැමිණි කල්හි: මරණය ජයෙන් ගිලිනා
-ලද්දේයයි ලියා තිබෙන වචනය
සම්පූර්ණවේ. [55]එම්බා මරණය, නුඹ ජය
කොයිද? [56]මරණයේ කටුව නම් පාපයය:
පාපයේ බලය නම් ව්‍යවස්ථාවය. [57]නුමුත්
අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ
කරණකොටගෙන අපට ජය දෙන්නාවූ
දෙවියන් වහනසේට ස්තුතිවේවා. [58]එහෙ-
යින් මාගේ ප්‍රේමවන්ත සහෝදයෙනි,
ස්වාමීන් වහන්සේ කෙරෙහි නුඹලගේ
මෙහෙය නිෂ්ඵප නොවන බව නුඹලා
දන්නා බැවින් ස්ථිරවව්. නිශ්චලවව්,
නිතරම ස්වාමීන් වහන්සේගේ මෙහෙයෙහි
වඩා වඩා පවතිව්.

# නැතිවූ පුත්‍රයා

11තවද උන්වහන්සේ කියනසේක්: එක්තරා
මනුෂ්‍යයෙකුට පුත්‍රයෝ දෙදෙනෙක් සිටි-
යෝය. 12ඔවුන්ගෙන් බාලයා: පියාණෙනි,
ඔබගේ වස්තුවෙන් මට එන කොටස
දෙන්නැයි පියාට කීවේය. එවිට ඔහු
තමාගේ සම්පත් ඔවුන්ට බෙදාදුන්නේය.
13නොබෝ දවසකට පසු බාල පුත්‍රයා
සියල්ල එකතුකරගෙන, දුර රටකට ගොස්,
එහිදී අවකල් ක්‍රියාවෙන් ජීවත්වෙමින්,
තමාගේ වස්තුව නාස්ති කෙළේය. 14ඔහු
සියල්ල වියදම්කළ පසු, ඒ රටේ මහත්
සාගතයක් හටගැනී, ඔහුට හිඟවෙන්ට
පටන් ගත්තේය. 15එවිට ඔහු ගොස් ඒ
රටේ වැසියෙකුට බැඳුණේය: හෙතෙම
ඌරන්ට ගොදුරු කවන පිණිස තමාගේ
කෙත්වලට ඔහු යැවීය. 16ඔහු ඌරන් කෑ
කරල්වලින් තමාගේ බඩ පුරවා ගන්ට
කැමතිවුයේය; කිසිවෙක්ද ඔහුට කිසිවක්
දුන්නේ නැත. 17එහෙත් ඔහු සිහිඋපදවා
කථාකොට: මාගේ පියාණන්ගේ කුලීකාර
-යන් එපමණ දෙනෙකුට ඕනෑවට වඩා
කෑම තිබේද්දී මම මෙහි බඩගින්නේ නසිමි!
18මම නැගිට මාගේ පියාණන් ළඟට ගොස්:
පියාණෙනි, ස්වර්ගයට විරුද්ධවද ඔබ
ඉදිරියෙහිද පව්කෙළෙමි. 19තවත් ඔබගේ
පුත්‍රයායයි කියනු ලබන්ට නොවටිමි.
ඔබගේ කුලීකාරයන්ගෙන් එක්කෙනෙකු
මෙන් මා තබාග මැනවයි ඔහුට කියන්නෙ
-මියි කියා, 20නැගිට තමාගේ පියා ළඟට
ගියේය. ඔහු දුර සිටියදීම ඔහුගේ පියා
ඔහු දැක, අනුකම්පාවී, දුවගන ගොස්,
ඔහුගේ බෙල්ල වැළඳගෙන, ඔහු සිඹ -
ගත්තේය. 21එවිට පුත්‍රයා ඔහුට කථා -
කොට: පියාණෙනි, ස්වර්ගයට විරුද්ධව
-ද ඔබ ඉදිරියෙහිද පව්කෙළෙමි. තවත්
ඔබගේ පුත්‍රයායයි කියනු ලබන්ට නොවටිමි
-යි කීවේය. 22නුමුත් පියා තමාගේ
දාසයන්ට කථාකොට: ඉතා හොඳ සළුව
වහාම ගෙනැවිත් මොහුට හඳවන්න;
මොහුගේ ඇඟිල්ලේ මුද්‍රවක්ද පාදවලට
වහන්ද දමන්න. 23තරකළ වස්සා ගෙනැවිත්
මරන්න, අපි කමින් ප්‍රීතිවෙමු. 24මක්නිසාද
මේ මාගේ පුත්‍රයා නැසී, නැවත ජීවත්ව
සිටියි; ඔහු නැතිවී, සම්බවීයයි කීවේය.
එවිට ඔව්හු ප්‍රීතිවෙන් ට පටන්ගත්තෝය.
25ඔහුගේ වැඩි මහල් පුත්‍රයා කෙතෙහි
සිටියේය. ඔහු ඇවිත් ගෙදරට ළංවූ කළ,
තූර්යනාදයත් නැටීමත් ඇසී, 26දාසයන්ගෙන්
එකිකෙනෙකුට හඬගසා: මේ මොකදැයි
විචාළේය. 27ඔහුද: ඔබගේ සහෝදරයා
ආවේය; ඔබගේ පියාණෝ ඔහු සුවසේ
පිළිගත් බැවින්, තරකළාවූ වස්සා
මැරෙව්වේයයි කීවේය. 28එවිට ඔහු කිපී,
ගෙට ඇතුල්වෙන්ට නොකැමති වූයේය.
එබැවින් ඔහුගේ පියා පිටතට ඇවිත්, එන
මෙන් ඔහුගෙන් ඉල්ලුවේය. 29නුමුත් ඔහු
උත්තරදෙමින්: මෙපමණ අවුරුදු ගණනක්
ඔබට සේවයකරමින් සිටිමි, කවදාවත්
ඔබගේ ආඥාවක් කඩ නොකෙළෙමි. එසේවී
නුමුත් මාගේ මිත්‍රයන් සමඟ ප්‍රීතිවෙන්ට
ඔබ එළු පැටවෙකුවත් කිසිකලක මට
නුදුන්නෙහිය. 30නුමුත් ඔබගේ සම්පත
වේශ්‍යාවන් සමඟ නාස්තිකළාවූ මේ ඔබගේ
පුත්‍රයා ආ වේලේ, ඔහු නිසා තරකළ
වස්සා මැරුවෙහියයි පියාට කීවේය. 31ඔහුද
පුත්‍රය, නුඹ නිතරම මා සමඟ සිටිනෙහිය,
මා සන්තක සියල්ලද නුඹේය. 32නුමුත්
අපි විසින් ප්‍රීති සන්තෝෂවෙන්නට යුතුව
තිබුණේය. මක්නිසාද මේ නුඹේ සහෝදරයා
නැසී නැවත ජීවත්ව සිටියි; නැතිවී
සම්බවීයයි කීයේයයි කීසේක.



NCEASL